


# 2022 අප්‍රේල් 19
# රඹුක්කන ප්‍රචණ්ඩත්වය

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

2022 අප්‍රේල් 19

# රඹුක්කන ප්‍රචණ්ඩත්වය

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

2022 දෙසැම්බර්

**දායකත්වය**


| | |
|---|---|
| *පර්යේෂණ සහාය:* | සුනෙත් ගජනායක<br>සමුදු බස්නායක |
| *විශේෂඥ දායකත්වය:* | නීතිඥ දිනූෂිකා දිසානායක |
| *සංස්කරණය:* | අජිත් පැරකුම් ජයසිංහ |
| *ව්‍යාපෘති සම්බන්ධීකරණය:* | ප්‍රසංග ප්‍රනාන්දු |
| *ව්‍යාපෘති කළමනාකරණය:* | රශ්මිකා විජේසිංහ |
| *අධීක්ෂණය:* | පිලිප් දිසානායක |
| *ප්‍රකාශනය:* | රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය |
| *මුද්‍රණය:* | adARTS - මහරගම |

# පටුන


**පෙරවදන** 4

**සංක්ෂේපය** 5

**ක්‍රමවේදය** 6

**පසුබිම** 8

**විරෝධතා දැක්වීමේ අයිතිය පිළිබඳ ජාත්‍යන්තර නීතිය සහ දේශීය නීති රාමුව** 10

**සිද්ධි අධ්‍යයන** 12

1. රඹුක්කනදී පොලිස් වෙඩි ප්‍රහාරයෙන් මිය ගිය කේ.ඩී චමින්ද ලක්ෂාන් 12
    - 1.1 පොලීසියේ මැදිහත්වීම සහ අනීතික වෙඩිතැබීම. 12
    - 1.2 කුරුවිටගේ දොන් චමින්ද ලක්ෂාන්ගේ මරණ පරීක්ෂණ වාර්තාව 13
    - 1.3 චමින්ද ලක්ෂාන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණයේ නිගමන අර්ථ නිරූපණය 15
    - 1.4 සිද්ධිය විමර්ශනය කරන නිලධාරීන්ගේ ස්වාධීනත්වය ගැන ඇති වූ සැකය 15
    - 1.5 නඩුවේ ආරම්භක තත්වය (නඩු අංකය බී/2424/22) 16
    - 1.6 සිදුවීම ඇසින් දුටු අය අධිකරණය ඉදිරියේ දුන් සාක්ෂි 17
    - 1.7 මිය ගිය චමින්ද ලක්ෂාන් ගේ බිරිඳ ගේ අදහස් 19
2. පොලිස් වෙඩි පහරින් බරපතළ තුවාල ලැබූ කේ.ඩි. අශේන් චාමිකර සමරනායක 19
3. බරපතල තුවාල ලැබූ ඩී.පී කමල් හේමජිත් කුමාර 20
4. පොලිස් වෙඩි පහරින් බරපතළ තුවාල ලැබූ බුද්ධික ලක්ෂාන් එදිරිසිංහ 21
5. පොලිස් ප්‍රහාරයට ලක් වූ 18 හැවිරිදි පාසල් සිසුවා 22
6. පොලිස් වෙඩි ප්‍රහාරයට ලක් වූ 14 හැවිරිදි පාසල් සිසුවෙකු වන එම්. ජී සහන් හසිත 23
7. පොලිස් වෙඩි පහරට ලක්ව තුවාල ලැබූ සහිදු රංගන 23
8. වෙඩි වැදී තුවාල වූ ආර්.ඒ. චමින්ද කුමාර රාජපක්ෂ 24
9. වෙඩි වැදී තුවාල වූ ඩබ්ලිව්. ඩී මිලංග හංසක වික්‍රමසූරිය 24

**ජාත්‍යන්තර ප්‍රජාවෙන් හා සිවිල් සමාජයෙන් ප්‍රතිචාර** 25

**රඹුක්කන සිදුවීම සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාව ගත් ක්‍රියාමාර්ග** 26

**පාර්ලිමේන්තු විවාදය** 27

**නීතිමය ක්‍රියාමාර්ග** 28

**වර්තමාන තත්වය** 29

**මියගිය හෝ තුවාල ලැබූවන් වෙනුවෙන් රජය ගෙන ඇති පියවර** 30

**නිගමනය** 31

**ආශ්‍රිත ලේඛන** 32

# පෙරවදන

ශ්‍රී ලංකාව රාජ්‍යයක් ලෙස තීරණාත්මක සන්ධිස්ථානයකට එළැඹ තිබේ. 2022 වසර විශේෂයෙන්ම ජනතා අරගල සම්බන්ධ දේශපාලනයේ සුසමාදර්ශී වෙනසක් සනිටුහන් කළේය. මහජනයා මුහුණ දුන් ආර්ථික දුෂ්කරතාවලට එරෙහිව රට පුරා පුළුල්ව පැතිරුණු ජනතා අරගලවලට ඉතිහාසයේ පෙර නොවූ විරූ අන්දමේ ජනතා සහයෝගයක් ලැබිණි. රට බංකොලොත් භාවයට ඇද දැමූ දේශපාලනය වෙනස් කරන ලෙස ඔවුහු ශක්තිමත්ව හඬ නැගූහ.

මාස කිහිපයක් රට තුළ පැවති විරෝධතා හමුවේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම පාහේ අකර්මන්‍යවූ අතර අරාජිකත්වයකට මග සැකසිණි. විරෝධතා මහා පරිමානයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන් පොලීසිය දැඩි ලෙස පීඩනයට පත් වූ අතර තත්ත්වය පාලනය කිරීම සඳහා ඔවුන් ද අරගල කරමින් සිටියහ. පෙනෙන්නට තිබුණු ආකාරය අනුව, දේශපාලන අධිකාරිය මහජන නැගිටීමට පෙර සාමාන්‍යයෙන් අනුගමනය කළ මර්දන උපක්‍රම මෙහිදී ද අනුගමනය කිරීම කෙරෙහි තිබුණේ අඩු නැඹුරුවකි. එහෙත්, වරින් වර මර්දනකාරී ක්‍රියා සිදුවිය.

2022 අප්‍රේල් 19 වන දින රඹුක්කනදී සිදුවූ පොලිස් වෙඩිතැබීම හා පහරදීම දැඩි විවේචනයට ලක්විය. එක් මරණයක් වාර්තා වූ අතර විශාල පිරිසකට බරපතල තුවාල සිදු විය.

වාර්තා තුනකින් සමන්විත අධ්‍යයන මාලාවක කොටසක් වන මෙම වාර්තාවෙන් අප අවධානය යොමු කරන්නේ 2022 අප්‍රේල් 19 වන දින රඹුක්කන පොලිස් වෙඩි තැබීමට අදාළ සිදුවීම් කෙරෙහිය. අනෙක් වාර්තා දෙක මගින් අධ්‍යයනය කරනු ලබන්නේ 2022 මැයි 9 දින ජනාධිපති ලේකම් කාර්යාලය අසල විරෝධතා භූමියට පහරදීමේ සිදුවීම සහ එම දිනයේම ආරම්භ වූ පළිගැනීමේ ප්‍රචණ්ඩත්වය පිළිබඳවයි.

විරෝධතාකරුවන්ගේ ක්‍රියාකලාපය, පොලිස් කඩාකප්පල්කාරී ක්‍රියාමාර්ගවල ගැටලු, නීතියෙන් පිට ඝාතන, වධහිංසා පැමිණවීම්, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ උදාසීනත්වය සහ හානිපූරණ ගැටලු හේතුවෙන් රඹුක්කන සිද්ධි අධ්‍යයනය ඉතා වැදගත් වේ.

වාර්තාවෙහිදී මෙම සිද්ධිය පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කරන අතර, ප්‍රචණ්ඩත්වයේ ගතිකත්වයන් ගෙනහැර දක්වමින් පද්ධතිය තුළ ගැඹුරින් මුල් බැස ඇති පොලිස් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලුවට විසඳුම් නිර්දේශ කරයි.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂ, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# සංක්ෂේපය

2022 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයකට තුඩු දුන් සමාජ ආර්ථික දේශපාලන ක්‍රමයේ වෙනසක් ඉල්ලා සිටින පුරවැසියන් විශාල සංඛ්‍යාවක් රට පුරා විරෝධතාවලට සම්බන්ධ වෙමින් සිටියහ. අප්‍රේල් 19 ට පෙර සති කිහිපය තුළ, අසල්වැසි පිරිස් විසින් තම පදිංචි ප්‍රදේශ ආසන්නයේ කුඩා විරෝධතා ලෙස ආරම්භ කළ උද්ඝෝෂණ ව්‍යාපාර ඉන්පසු මාර්ග අවහිර කිරීමට, පොදු ස්ථාන අල්ලා ගැනීමට සහ ප්‍රධාන දේශපාලන නායකයින් ඉල්ලා අස්විය යුතු යැයි බලකරමින් සංවිධානය වීමට යොමු වූ බහුජන අරගල ව්‍යාපාරයක් බවට පත් විය.

අප්‍රේල් 19 වැනි දින උදෑසන ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටි රඹුක්කනට දවස උදා වූයේ එවන් සන්දර්භයක් තුළය. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ඉවුම් පිහුම් සඳහා අවශ්‍ය ගෑස් ආදී ජීවත් වීමට අවශ්‍ය සියල්ල හිඟ වූ අතර ඉදිරි දිනවලදී මිල ඉහළ යාමට නියමිතව තිබිණි. රඹුක්කන නගරයේදී ඉන්ධන ලබා දෙන ලෙස ඉල්ලා රියදුරන් විසින් ආරම්භ කරන ලද උද්ඝෝෂණය විරෝධතාකරුවන්ට එරෙහිව පොලීසිය ජල ප්‍රහාර, කඳුළු ගෑස් සහ ජීව උණ්ඩ භාවිතා කිරීමත් සමග භයානක තත්වයකට පත්විය. පොලිස් කෲරත්වය හේතුවෙන් එක් අයෙකු මිය ගිය අතර කුඩා ළමුන් ඇතුළු කිහිප දෙනෙකුට තුවාල සිදු විය.

මෙම වාර්තාව සම්පාදනයේදී, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානයේ පර්යේෂණ කණ්ඩායම් නැවත රඹුක්කනට පැමිණ, අප්‍රේල් 19 සිදුවීම්වල ප්‍රතිඵල සිදුවීමෙන් මාස හතරකට පමණ පසු තිබුණු තත්වය අනුව ලේඛනගත කර ඇත. පොලිස් ම්ලේච්ඡත්වයේ ප්‍රතිඵලයක් ලෙස කායික හා මානසික පීඩාවන්ට ලක් වූ සාමාන්‍ය මිනිසුන්ගේ දුක් වේදනා සහ අධික ලෙස යෙදවූ බලය හේතුවෙන් සෘජු බලපෑමට ලක්වූවන්ගේ පවුල් මුහුණදුන් ප්‍රතිවිපාකවල සජීවී අත්දැකීම් එයින් හෙළිදරව් වේ. එය රාජ්‍ය වගකීම, පවුල්වලට වන්දි ගෙවීමේ අවශ්‍යතාව සහ එවැනි අවස්ථාවන්හිදී පොලිස් සේවයේ ප්‍රශ්නය සහ පොලිස් බලකායට අවශ්‍ය පුහුණුව, විනය සහ සබුද්ධිකභාවය පිළිබඳ ප්‍රශ්න ද මතු කරයි.

# ක්‍රමවේදය

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ පර්යේෂණ සහායකයන් විසින් රඹුක්කන ප්‍රදේශයේදී පිරිමින් සහ කාන්තාවන් සියයක් පමණ සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. මෙම වාර්තාවේ සොයාගැනීම් ඉදිරිපත් කිරීම සඳහා එය මාධ්‍ය වාර්තා, අධිකරණ ලේඛන සහ වෙනත් ලියකියවිලිවල ද්විතියික දත්ත මත ද විශ්වාසය තැබීය.

මෙම වාර්තාව සඳහා පර්යේෂකයන් සමග ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට එකඟ වූ වින්දිතයන්ගේ පවුල්වලට සහ වින්දිත හා බේරුණු පුද්ගලයන්ට කෘතඥතාව හිමි වේ. ඔවුන් දිගින් දිගටම ඉල්ලා සිටින්නේ පොලිසිය විසින් අධික ලෙස බලය යෙදවීම නිසා සමාජයට සිදු වූ හානියට සාධාරණයක් ඉටු කරන ලෙසයි.

අප්‍රේල් 19දා රඹුක්කනදී පැවැත්වුණු උද්ඝෝෂණයේ ප්‍රධාන තේමාව වූයේ ඉන්ධන සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙස ඉල්ලා සිටීමයි. එය ශ්‍රී ලංකාවේ අනෙකුත් ස්ථානවල සාමාන්‍ය ජනතාව පාරට බැස්සා සේම විය. රඹුක්කන නගරයේ දවල් දොළහ පමණ සිට ජනතාව ඉන්ධන බෙදාහරින ප්‍රධාන අලෙවිසැලට පිටතින් එක්රොක් වීමට පටන් ගත්හ. අප්‍රේල් 18 වැනිදා අලුයම සිට ඉන්ධනහලෙන් පිටත පෝලිම් ගැසී සිටි ත්‍රීරෝද රථ රියදුරන් සහ අනෙකුත් රියදුරන් ඉන්ධන අවසන් වූ බව දැනුම්දීමත් සමග දැඩි කැළඹීමකට පත්වූහ. අප්‍රේල් 18 වැනිදා රාත්‍රියේ ඉන්ධන තොගයක් පැමිණෙන බවට පොරොන්දු වුවද මධ්‍යම රාත්‍රිය වනතුරුත් බවුසරය පැමිණියේ නැත. එය පැමිණෙන විට ඉන්ධන මිල එක රැයින් ඉහළ ගොස් තිබූ අතර ඉන්ධන ලබා ගැනීමට පෝලිමේ සිටි ජනතාව පැරණි මිලටම ඉන්ධන විකුණන ලෙස ඉල්ලා බලපෑම් කිරීමට පටන් ගත්හ. ඔවුන් ඉන්ධන පිරවුම්හල ආසන්නයේ සාමකාමී විරෝධතාවක් ආරම්භ කළ අතර පිරවුම්හලේ කළමනාකාරීත්වය මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමත් සමග විරෝධතාව වර්ධනය විය. විරෝධතාකරුවෝ පාර මැද ටයර් පුළුස්සා ඉන්ධනහල ඉදිරිපිට ප්‍රධාන මාර්ගය අවහිර කිරීමට පටන් ගත්හ. විරෝධතාකරුවන් අතර බිස්කට් සහ ජලය බෙදා දුන් අතර විරෝධතාව සාමකාමීව පැවතිණි. විරෝධතාකරුවන් පසුව උඩරට දුම්රිය මාර්ගය ද අවහිර කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දුම්රිය බලධාරීන් විසින් දුම්රිය ගමන් වාර 16ක් පමණ අවලංගු කරන ලදී. මෙලෙස දුම්රිය මාර්ගය සහ මාර්ගය අවහිර වීම හේතුවෙන් රඹුක්කන නගරය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල වාහන තදබදය ද වැඩි විය. පොලිස් බළකාය සහ කැරලි මර්දන පොලිසිය එම ප්‍රදේශයට පැමිණීමට පටන් ගත්තේය. විරෝධතාකරුවන් මාර්ගය මෙන්ම දුම්රිය මාර්ගය ද අවහිර කරමින් දුම්රිය මාර්ගය හරහා අවසානයේ පැමිණි ඉන්ධන බවුසරය නවතා දමමින් දිගින් දිගටම උද්ඝෝෂණය කළහ. ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන පොම්පයටද නාඳුනන පිරිසක් ගිනි තැබීමට උත්සාහ කළහ.

පොලිසිය මුලින්ම විරෝධතාකරුවන්ට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළහ. මේ හේතුවෙන් ඇතැම් විරෝධතාකරුවන් පොලිසියට ගල් මුල් ප්‍රහාර එල්ල කිරීමට ද පටන් ගත්හ. එවිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.බී. කීර්තිරත්න මහතා 'අවම බලය' යොදා තත්ත්වය පාලනය කිරීම සඳහා ජීව උණ්ඩ භාවිත කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇතැයි පැවසේ. ඉන් අනතුරුව ඇතිවූ වෙඩි තැබීම හේතුවෙන් තම යතුරුපැදිය ඉන්ධනහලෙන් ඉවතට ගැනීමට තැත් කළ කේ.ඩී.චමින්ද ලක්ෂාන් නමැත්තාගේ උදරයට වෙඩිවැදී සිදුවූ තුවාල හේතුවෙන් මියගියේය. වයස අවුරුදු 18ට අඩු ළමයෙකු ඇතුළු තවත් 27දෙනෙකු තුවාල ලැබූහ. එම 27දෙනාගෙන් දස දෙනෙකු පොලිස් නිලධාරීන් වේ. නාඳුනන පුද්ගලයින් ත්‍රිරෝද රථයකට ගිනි තැබීමෙන් පසු ජීව උණ්ඩ භාවිත කළ බවත්, දුම්රිය මාර්ගය හරහා නවතා තිබූ ඉන්ධන බවුසරයට ද ගිනි තැබීමට උත්සාහ කළ බවත්, පොලිස් බැටන් ප්‍රහාරයක් එල්ල කිරීමෙන් තත්ත්වය පාලනය කළ නොහැකි වූ බවත් පොලිස්පතිවරයා ප්‍රකාශ කර තිබුණි. අහසට වෙඩි තැබීමෙන් ද තත්ත්වය පාලනය කළ නොහැකි වූ බවත්, දණහිසට පහළින් වෙඩි තැබීමට අණ කළ බවත් පවසමින් ඔහු පොලිස් නිලධාරීන් ජීව උණ්ඩ භාවිතා කිරීම තවදුරටත් සාධාරණීකරණය කළේය.

විරෝධතාවක සන්දර්භය තුළ මහජන සාමය සහතික කිරීම සඳහා ජීව උණ්ඩ භාවිතා කිරීම අවසාන විසඳුම වේ. මෙම අවස්ථාවේදී නාඳුනන පුද්ගලයන් විසින් ඉන්ධනහලට හා වහා ගිනි ඇවිළෙන සුලු ඉන්ධන රැගත් බවුසරයකටද ගිනි තැබීමට උත්සාහ කිරීමත් සමග විශාල පිපිරුම් අවදානමක් මතුව තිබේ. පොලිස් නිලධාරීන් ගත් පියවරවලින් පෙනී යන්නේ ඔවුන් බැටන් ප්‍රහාරයක් සහ කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කිරීමට උත්සාහ කර, ඉන් අනතුරුව, විරෝධතාකරුවන් සහ වීදිවල සාමාන්‍ය පුද්ගලයින් පැහැදිලිවම තුවාල ලබන හා මරණ අවදානමකට ලක්වන තත්වයක් තුළ වහාම ජීව උණ්ඩ භාවිතා කිරීමට පටන් ගත් බවයි. මෙම වාර්තාව සඳහා පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලදී හෙළි වූයේ පොලිස් නිලධාරීන් විසින්ම විරෝධතාකරුවන්ට ගල් මුල් ප්‍රහාර එල්ල කරන අයුරු දක්නට ලැබුණු බවයි.

වීඩියෝ සාක්ෂි මගින් තහවුරු කර ඇති තත්ත්වය අනුව, මිනිසුන් පාරේ දුවන ආකාරය අනුව සහ දිවි ගලවා ගත් අයගේ සාක්ෂි අනුව පෙන්නුම් කරන්නේ පොලිස් වෙඩි තැබීමෙන් බේරීමට සමහරු දුම්රිය මාර්ගය හරහා දිව ගිය බවයි. කෙසේ වෙතත් සමහරුන්ට වෙඩි වැදී ඇත. පොලිසියේ ප්‍රතිචාරය නීතිය හා සාමය ආරක්ෂා කිරීම සහ තත්ත්වය සමනය කිරීමට සීමා වූ බවක් නොපෙනේ. දිවි ගලවා ගත් සමහර අයගේ සාක්ෂිවලින් පැහැදිලි වන පරිදි විරෝධතාකරුවන්ගෙන් පළිගැනීම හෝ දඬුවම් කිරීම ඔවුන්ගේ අරමුණ වී තිබේ. වෙඩි වැදුණු අය දුක්විඳිය යුතු බව ඇතැම් පොලිස් නිලධාරීන් පැවසූ බව ද, ඇතැම් අවස්ථාවල තුවාලකරුවන් රෝහල්ගත කිරීමට උත්සාහ කළ අයට පොලිස් නිලධාරීන් බාධා කර ඇති බව ද වාර්තා වේ. පොලිසිය වෙඩි වැදී තුවාල ලබා සිටි රෝගීන්ට පවා පහරදුන් බව වාර්තා වේ. වින්දිතයින් කිහිප දෙනෙකු සහ ඔවුන්ගේ පවුල් විසින් මෙය සනාථ කරන ලදී.

මෙම සන්දර්භය තුළ, බලධාරීන්ගේ ප්‍රතිචාරය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති ප්‍රකාශනයේ, සංවිධානය වීමේ සහ රැස්වීමේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය කරමින් බලය ඉක්මවා ගොස් ඇති බව පැහැදිලිය. පහත දැක්වෙන සාක්ෂිවලින් පෙනී යන පරිදි, සිද්ධියෙන් පොලිස් වෙඩි පහරින් මියගිය චමින්ද ලක්ෂාන්ගේ පවුල සෘජු මානසික කම්පනයකට සහ පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා අහිමිවීමට ලක්ව ඇති අතර සිද්ධියෙන් මාස හතකට පසු පවා ඔවුන්ට වන්දි ලැබී නොතිබිණි.

# පසුබිම

අප්‍රේල් 19දා රඹුක්කන දී පැවැත්වුණු උද්ඝෝෂණයේ ප්‍රධාන තේමාව වූයේ ඉන්ධන සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙස ඉල්ලා සිටීමයි. එය ශ්‍රී ලංකාවේ අනෙකුත් ස්ථානවල සාමාන්‍ය ජනතාව පාරට බැස්සා සේම විය. රඹුක්කන නගරයේ දවල් දොළහ පමණ සිට ජනතාව ඉන්ධන බෙදාහරින ප්‍රධාන අලෙවිසැලට පිටතින් එක්රොක් වීමට පටන් ගත්හ. අප්‍රේල් 18 වැනිදා අලුයම සිට ඉන්ධනහලෙන් පිටත පෝලිම් ගැසී සිටි ත්‍රීරෝද රථ රියදුරන් සහ අනෙකුත් රියදුරන් ඉන්ධන අවසන් වූ බව දැනුම් දීමත් සමග දැඩි කැළඹීමකට පත්වූහ. අප්‍රේල් 18 වැනිදා රාත්‍රියේ ඉන්ධන තොගයක් පැමිණෙන බවට පොරොන්දු වුවද මධ්‍යම රාත්‍රිය වනතුරුත් බවුසරය පැමිණියේ නැත. එය පැමිණෙන විට ඉන්ධන මිල එක රැයින් ඉහළ ගොස් තිබූ අතර ඉන්ධන ලබා ගැනීමට පෝලිමේ සිටි ජනතාව පැරණි මිලටම ඉන්ධන විකුණන ලෙස ඉල්ලා බලපෑම් කිරීමට පටන් ගත්හ. ඔවුන් ඉන්ධන පිරවුම්හල ආසන්නයේ සාමකාමී විරෝධතාවක් ආරම්භ කළ අතර පිරවුම්හලගේ කළමනාකාරිත්වය මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමත් සමග විරෝධතාව වර්ධනය විය. විරෝධතාකරුවෝ පාර මැද ටයර් පුළුස්සා ඉන්ධනහල ඉදිරිපිට ප්‍රධාන මාර්ගය අවහිර කිරීමට පටන් ගත්හ. විරෝධතාකරුවන් අතර බිස්කට් සහ ජලය බෙදා දුන් අතර විරෝධතාව සාමකාමීව පැවතිණි. විරෝධතාකරුවන් පසුව උඩරට දුම්රිය මාර්ගය ද අවහිර කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දුම්රිය බලධාරීන් විසින් දුම්රිය ගමන් වාර 16ක් පමණ අවලංගු කරන ලදී. මෙලෙස දුම්රිය මාර්ගය සහ මාර්ගය අවහිර වීම හේතුවෙන් රඹුක්කන නගරය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල වාහන තදබදය ද වැඩි විය. පොලිස් බළකාය සහ කැරලි මර්දන පොලිසිය එම ප්‍රදේශයට පැමිණීමට පටන් ගත්තේය. විරෝධතාකරුවන් මාර්ගය මෙන්ම දුම්රිය මාර්ගය ද අවහිර කරමින් දුම්රිය මාර්ගය හරහා අවසානයේ පැමිණි ඉන්ධන බවුසරය නවතා දමමින් දිගින් දිගටම උද්ඝෝෂණය කළහ. ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන පොම්පයට ද නාඳුනන පිරිසක් ගිනි තැබීමට උත්සාහ කළහ.

පොලිසිය මුලින්ම විරෝධතාකරුවන්ට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළහ. මේ හේතුවෙන් ඇතැම් විරෝධතාකරුවන් පොලිසියට ගල් මුල් ප්‍රහාර එල්ල කිරීමට ද පටන් ගත්හ. එවිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ. බී. කීර්තිරත්න මහතා 'අවම බලය' යොදා තත්ත්වය පාලනය කිරීම සඳහා ජීව උණ්ඩ භාවිත කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇතැයි පැවසේ. ඉන් අනතුරුව ඇතිවූ වෙඩි තැබීම හේතුවෙන් තම යතුරුපැදිය ඉන්ධනහලෙන් ඉවතට ගැනීමට තැත් කළ කේ.ඩී. චමින්ද ලක්ෂාන් නමැත්තාගේ උදරයට වෙඩිවැදී සිදුවූ තුවාල හේතුවෙන් මිය ගියේය. වයස අවුරුදු 14ක ළමයෙකු ඇතුළු තවත් 27දෙනෙකු තුවාල ලැබූහ. එම 27දෙනාගෙන් දස දෙනෙකු පොලිස් නිලධාරීන් වේ. නාඳුනන පුද්ගලයින් ත්‍රිරෝද රථයකට ගිනි තැබීමෙන් පසු ජීව උණ්ඩ භාවිත කළ බවත්, දුම්රිය මාර්ගය හරහා නවතා තිබූ ඉන්ධන බවුසරයට ද ගිනි තැබීමට උත්සාහ කළ බවත්, පොලිස් බැටන් ප්‍රහාරයක් එල්ල කිරීමෙන් තත්වය පාලනය කළ නොහැකි වූ බවත් පොලිස්පතිවරයා ප්‍රකාශ කර තිබුණි. අහසට වෙඩි තැබීමෙන් ද තත්ත්වය පාලනය කළ නොහැකි වූ බවත්, දණහිසට පහළින් වෙඩි තැබීමට අණ කළ බවත් පවසමින් ඔහු පොලිස් නිලධාරීන් ජීව උණ්ඩ භාවිතා කිරීම තවදුරටත් සාධාරණීකරණය කළේය.

විරෝධතාවක සන්දර්භය තුළ මහජන සාමය සහතික කිරීම සඳහා ජීව උණ්ඩ භාවිතා කිරීම අවසාන විසඳුම වේ. මෙම අවස්ථාවේදී නාඳුනන පුද්ගලයන් විසින් ඉන්ධනහලට හා වහා ගිනි ඇවිළෙනසුලු ඉන්ධන රැගත් බවුසරයකට ද ගිනි තැබීමට උත්සාහ කිරීමත් සමග විශාල පිපිරුම් අවදානමක් මතුව තිබේ. පොලිස් නිලධාරීන් ගත් පියවරවලින් පෙනී යන්නේ ඔවුන් බැටන් ප්‍රහාරයක් සහ කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කිරීමට උත්සාහ කර, ඉන් අනතුරුව, විරෝධතාකරුවන් සහ වීදිවල සාමාන්‍ය පුද්ගලයින් පැහැදිලිවම තුවාල ලබන හා මරණ අවදානමකට ලක්වන තත්වයක් තුළ වහාම ජීව උණ්ඩ භාවිතා කිරීමට පටන් ගත් බවයි. මෙම වාර්තාව සඳහා පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලදී හෙළි වූයේ පොලිස් නිලධාරීන් විසින්ම විරෝධතාකරුවන්ට ගල් මුල් ප්‍රහාර එල්ල කරන අයුරු දක්නට ලැබුණු බවයි.

වීඩියෝ සාක්ෂි මගින් තහවුරු කර ඇති තත්ත්වය අනුව, මිනිසුන් පාරේ දුවන ආකාරය අනුව සහ දිවි ගලවා ගත් අයගේ සාක්ෂි අනුව පෙන්නුම් කරන්නේ පොලිස් වෙඩි තැබීමෙන් බේරීමට සමහරු දුම්රිය මාර්ගය හරහා දිව ගිය බවයි. කෙසේ වෙතත් සමහරුන්ට වෙඩි වැදී ඇත. පොලිසියේ ප්‍රතිචාරය නීතිය හා සාමය ආරක්ෂා කිරීම සහ තත්වය සමනය කිරීමට සීමා වූ බවක් නොපෙනේ. දිවි ගලවා ගත් සමහර අයගේ සාක්ෂිවලින් පැහැදිලි වන පරිදි විරෝධතාකරුවන්ගෙන් පළිගැනීම හෝ දඬුවම් කිරීම ඔවුන්ගේ අරමුණ වී තිබේ. වෙඩි වැදුණු අය දුක් විඳිය යුතු බව ඇතැම් පොලිස් නිලධාරීන් පැවසූ බව ද, ඇතැම් අවස්ථාවල තුවාලකරුවන් රෝහල්ගත කිරීමට උත්සාහ කළ අයට පොලිස් නිලධාරීන් බාධා කර ඇති බව ද වාර්තා වේ. පොලිසිය වෙඩි වැදී තුවාල ලබා සිටි රෝගීන්ට පවා පහරදුන් බව වාර්තා වේ. වින්දිතයින් කිහිප දෙනෙකු සහ ඔවුන්ගේ පවුල් විසින් මෙය සනාථ කරන ලදී.

මෙම සන්දර්භය තුළ, බලධාරීන්ගේ ප්‍රතිචාරය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති ප්‍රකාශනයේ, සංවිධානය වීමේ සහ රැස්වීමේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය කරමින් බලය ඉක්මවා ගොස් ඇති බව පැහැදිලිය. පහත දැක්වෙන සාක්ෂිවලින් පෙනී යන පරිදි, සිද්ධියෙන් පොලිස් වෙඩි පහරින් මියගිය චමින්ද ලක්ෂාන්ගේ පවුල සෘජු මානසික කම්පනයකට සහ පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා අහිමි වීමට ලක්ව ඇති අතර සිද්ධියෙන් මාස හතකට පසු පවා ඔවුන්ට වන්දි ලැබී නොතිබිණි.

# විරෝධතා දැක්වීමේ අයිතිය පිළිබඳ ජාත්‍යන්තර නීතිය සහ දේශීය නීති රාමුව

ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) අනුව, ප්‍රකාශනයේ නිදහස, සාමකාමීව රැස්වීමේ සහ සංවිධානය වීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයට පැහැදිලි බැඳීමක් තිබේ. මෙම අයිතිවාසිකම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (අ), (ආ) සහ (ඇ) ව්‍යවස්ථාවන් විසින් ද තහවුරු කර ඇති අතර නීතියෙන් මෙම අයිතිවාසිකම් සීමා කළ හැකි සීමිත අවස්ථාවන් වන්නේ 'වාර්ගික හා ආගමික සමගිය, පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදක් සඳහා පෙළඹවීම' සම්බන්ධයෙන් පමණි. සංවිධානය වීමේ නිදහස ජාතික ආර්ථිකයේ අවශ්‍යතා සම්බන්ධයෙන් ද සීමා කළ හැකි අතර රැස්වීමේ නිදහස සීමා කළ හැක්කේ වාර්ගික හා ආගමික සහජීවනය සඳහා පමණි.

බලය සහ ගිනි අවි භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මවල (BPUFF) පැහැදිලිව සඳහන් වන්නේ මානව හිමිකම් නීති ප්‍රමිතීන්ට අනුකූලව තම රාජකාරි ඉටු කිරීමට සහ බලය භාවිතා කිරීම අවම කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේදී අඩුවෙන් මාරාන්තික ආයුධ පරාසයක් භාවිතා කළයුතු බවයි. මෙම බලය හිමි වන්නේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අවම බලය භාවිතා කිරීමටත්, බලය යෙදවිය යුතු සහ එසේ නොකළයුතු අවස්ථා අතර වෙනස හඳුනා ගැනීමටත් හැකි වන පරිදි ය. අවම වශයෙන් මාරාන්තික අවි ඇතුළු ආයුධ විරෝධතාකරුවන්ට එරෙහිව භාවිතා කළ යුත්තේ එසේ කිරීමට නීත්‍යානුකූලව අවසර තිබේ නම් (එනම් අදහස් ප්‍රකාශ කිරීමේ, රැස්වීමේ සහ සංවිධානය වීමේ අයිතියට ගරු කිරීම සහ ආරක්ෂා කරන පසුබිමක් තුළ), අවශ්‍යම නම් සහ නීත්‍යානුකූල අරමුණක් වෙනුවෙන් පමණක් නම් පමණි. මෙහිදී නාඳුනන පිරිසක් විසින් ඉන්ධන බවුසරයකට හෝ ඉන්ධන හලකට ගිනි තැබීමෙන් සිදුවිය හැකි හානියෙන් මහජනතාව ආරක්ෂා කර ගැනීම නීත්‍යානුකූල අරමුණක් ලෙස සැලකිය හැකිය. පළායන විරෝධතාකරුවන්ට සහ අවට සිටින අයට පවා වෙඩි තැබීම සඳහා මාරාන්තික අවි භාවිත කිරීම නීත්‍යානුකූල අරමුණක් වන්නේ නැත. විරෝධතාකරුවන් විසින් භාවිතා කරන ලද එකම ආයුධය ඔවුන් මාර්ගයෙන් හෝ දුම්රිය මාර්ගයෙන් අහුලාගන්නා ලද ගල් බව සලකන විට එවැනි මාරාන්තික අවි භාවිතා කිරීමක් අවශ්‍ය හෝ සමානුපාතික නොවේ. විරෝධතාකරුවන් ඝාතනය කිරීම සඳහා ඔවුන්ට වෙඩි තැබීමට පොලිස් අධීක්ෂකවරුන් විසින් සපයන ලද උපදෙස් අවශ්‍යතාවට අනුව නීත්‍යානුකූල වන්නේ නැත. එසේම, වළක්වා ගත යුතු හානියට සමානුපාතික නොවේ. මෙම අවස්ථාවේදී මාරක අවි භාවිත කළේ ද හැකි අවම හානියක් කිරීමේ අරමුණින් නොවේ. විපතට පත් වූවන්ගේ තුවාල අනුව පෙන්නුම් කරන්නේ වෙඩි තැබීම දණහිසට ඉහළින් ඉලක්ක කර සිදුකර තිබෙන බවයි. එමගින් විරෝධතාකරුවන්ට සිදුවිය හැකි උපරිම ශාරීරික හානියක් සිදු වූ අතර එක් මරණයක් ද සිදු විය. ඉලක්ක නොමැතිව අහසට වෙඩි තැබීම ද අනතුරුදායක වන අතර බිමට පතිත වන උණ්ඩ කැබලි මරණයට හේතු විය හැකිය. එසේම, එයට බාධා කරන ඕනෑම කෙනෙකුට එමගින් හානි සිදුකළ හැකිය.

දිසා කිහිපයකින් පලා යන සෙනගක් දෙසට පොලිස් නිලධාරීන්ගේ වෙඩි තැබීම් ද අහඹු ලෙස සිදු වන බව මේ අවස්ථාවේදී අපට පෙනේ. පහත දැක්වෙන සිද්ධි අධ්‍යයනයන්හි සඳහන් වන ආකාරයට, වින්දිතයින්ට වෙඩි තබා ඇත්තේ අතුරු මාර්ගයක ඉන්ධන පිරවුම්හලක් වෙත ළඟා වෙමින් සිටියදී, දුම්රිය මාර්ගයක් හරහා යමින් සිටියදී සහ ප්‍රධාන මාර්ගයක් දිගේ පලා යමින් සිටියදීය. කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කරමින් තිබියදී වෙඩි තැබීම සිදු වීම නිසා ඕනෑම අවස්ථාවක බලධාරීන්ගේ දර්ශනයට බාධාවක් වී මාරාන්තික අවියක් භාවිත කිරීමේදී නිවැරදි බව තහවුරු කිරීම දුෂ්කර විය හැකිය. වින්දිතයින්ට දණහිසට ඉහළින් වෙඩි වැදීමෙන් පෙනී යන්නේ, නිලධාරීන්ට එවැනි ආයුධ භාවිතා කිරීමට අවශ්‍ය නම් ඔවුන්ට වඩා හොඳ පුහුණුවක් පමණක් නොව, මාරාන්තික ආයුධ භාවිතය අවසාන විසඳුම බව වටහා ගැනීමේ අවබෝධය ද අවශ්‍ය බවය. විශේෂයෙන් ඉලක්කය කරා නිවැරදිව ළඟා වීමට ඇති අභියෝග සැලකිල්ලට ගත යුතුය.

සක්‍රිය විරෝධතාවක් වැනි අස්ථාවර තත්වයක් තුළ නිවැරදිව ඉලක්කය ලබාගැනීම අතිශය දුෂ්කරය. මෙම අවස්ථාවේදී කිසි විටෙකත් මාරාන්තික අවි භාවිත නොකළ යුතු බව පැහැදිලි වන අතර, කේ.ඩී. චමින්ද ලක්ෂාන් මරණයට පත්වූයේ පොලිසිය විසින් කරන ලද අධික, අනවශ්‍ය සහ අසමානුපාතික බලය යෙදවීම හේතුවෙනි.

කඳුළු ගෑස් භාවිතය සම්බන්ධයෙන් සැලකූ කල, එය වසර පුරා විරෝධතාවලට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා බලධාරීන් විසින් අධික ලෙස භාවිතා කර ඇති බව පෙනේ. ඇත්ත වශයෙන්ම, කඳුළු ගෑස් භාවිතා කළ යුත්තේ කලාතුරකිනි. එසේ කළ යුත්තේ ද නිශ්චිත ප්‍රචණ්ඩකාරී පුද්ගලයින් පමණක් ඉලක්ක කරගෙන, පාලනය කළ නොහැකි වන පරිදි ජන සමූහය ප්‍රචණ්ඩකාරී වන්නේ නම් පමණි. එසේ වුවද, කඳුළු ගෑස් භාවිතා කළ යුත්තේ අඩු හානිකර ක්‍රම උත්සාහ කිරීමෙන් පසුව පමණි. මිනිසුන්ට ප්‍රදේශයෙන් පිටවීමට නොහැකි තත්වයක් තුළදී එය කිසි විටෙක භාවිතා නොකළ යුතුය. මෙම අවස්ථාවේදී පොලිසිය කඳුළු ගෑස් භාවිතා කළ අතර කඳුළු ගෑස් හේතුවෙන් දෘෂ්‍යතාව අඩුවීමත් සමග විරෝධතාවය පැවති දෙසට සජීවී පතුරම් මගින් ද වෙඩි තැබීමට පටන් ගත්තේය. විරෝධතා මධ්‍යයේ සිට පළායමින් සිටි අයට ද වෙඩි වැදී ඇති බැවින් මෙමගින් සාමාන්‍ය ජනයාට ද අනතුරක් සිදුවීමට ඉඩ තිබුණු බව පැහැදිලිය. තුවාලකරුවන් රෝහල් වෙත රැගෙන යාමට පෞද්ගලික වාහන රැගෙන ගිය පුද්ගලයන්ගේ සාක්ෂිවලින් පැහැදිලි වන පරිදි වෛද්‍ය ප්‍රතිකාර ද ක්ෂණිකව ලබා ගත නොහැකි විය.

ඊටත් වඩා වැදගත් වන්නේ පොලිසිය විසින්ම තුවාල ලැබූ විරෝධතාකරුවන්ට පයින් ගැසූ බවට හා වෛද්‍ය මැදිහත්වීම් ප්‍රමාද කළ බවට හෝ ඒ සඳහා සහාය නොදැක්වූ බවට වින්දිතයන්ගෙන් එල්ල වන චෝදනාය. බලධාරීන්ගේ මූලික වගකීම වන්නේ ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීම සහ විරෝධතාකරුවන්ට අදහස් ප්‍රකාශ කිරීමේ සහ රැස්වීමේ නිදහස සඳහා ඇති අයිතිය දිගටම ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදීමයි. මෙම අවස්ථාවේ දී, පොලිසියේ අභිප්‍රේරණය මහජන සාමය ආරක්ෂා කිරීමෙන් ඔබ්බට ගොස් ඇති බව සහ විරෝධතාවන්ට සහභාගී වූවා යයි සැලකුණු පුද්ගලයන්ගෙන් පළිගැනීම බව පෙනේ.

මෙම සිද්ධීන් සියුම්ව විමර්ශනය කිරීමේ අවශ්‍යතාව සහ ඊට සම්බන්ධ වූවන්ට නඩු පැවරීමේ අධිකරණ ක්‍රියාදාමයන් සමඟ වින්දිතයින්ට වන්දි සහ හානිපූරණයන් ලබා දීම සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. සිද්ධි අධ්‍යයනවලින් පෙන්නුම් කරන පරිදි, වින්දිතයින් කිහිප දෙනෙකුට පවත්නා ආර්ථික අර්බුදය මධ්‍යයේ වෛද්‍ය සේවා සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවී ඇති අතර රෝහලෙන් පිටවීමෙන් පසු අඛණ්ඩ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට පවා ඉන්ධන හිඟය හේතුවෙන් දුෂ්කරතා මතු වී තිබේ. චමින්ද ලක්ෂාන්ගේ පවුලට ආදායම් උපයන්නකු අහිමි වීම මිල කළ නොහැකි පාඩුවකි. මෙම පාඩු සඳහා වන්දි ලබාගැනීමට ඔවුන්ට ඇති අයිතිය ලබාදීමට රාජ්‍යය ප්‍රමුඛත්වය දිය යුතුය.

මීට අමතරව, පොලිස් බලකාය තුළ වැඩි දියුණු කළ පුහුණුවක සහ වගවීමක අවශ්‍යතාව ද ඒ හා සමානව පැහැදිලිව පෙනේ. පොලීසිය තුළ වසර ගණනාවක පුහුණුවීම් සහ ධාරිතා ගොඩනැංවීම සිදුකර තිබියදීත්, මෙවැනි සිදුවීමක් මගින් අවධාරණය කරන්නේ ආදර්ශවත්, මානව හිමිකම් හිතකාමී නිලධාරීන්ගේ අවශ්‍යතාවයි. එසේම, නීතිය කඩකරන්නන් සඳහා විනය ක්‍රියාවලීන් සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් පාලනය කරන රෙගුලාසි යන දෙකෙහිම අවශ්‍යතාවයයි. මහජන විරෝධයක් සම්බන්ධයෙන් මෙවන් ප්‍රතිචාරයක් කිසි දිනෙක නැවත සිදු නොවීමට ශ්‍රී ලංකා බලධාරීන් වග බලා ගත යුතුය.

# සිද්ධි අධ්‍යයන

## 1. රඹුක්කනදී පොලිස් වෙඩි ප්‍රහාරයෙන් මිය ගිය කේ.ඩී චමින්ද ලක්ෂාන්

සුළු පරිමාණයෙන් විවිධ ව්‍යාපාර කටයුතු ජීවනෝපාය සඳහා කළ කරඳගස්තැන්න, නාරම්බැද්ද, හිරිවඩුන්න, රඹුක්කන ජීවත් වූ 42 හැවිරිදි කේ.ඩී. චමින්ද ලක්ෂාන් මහතා දෙදරු පියෙකි. ඔහුගේ බිරිඳ සමන් ප්‍රියංගනී වන අතර ඔවුන්ගේ දරු දෙදෙනාගෙන් වැඩිමල් දියණියට අවුරුදු 20ක් සහ පුතුට අවුරුදු 15 කි.

තවද චමින්ද ලක්ෂාන් මහතාට එරෙහිව මහාධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවර ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා මාධ්‍ය වෙත ප්‍රකාශ කළේය. ඔහු කියා සිටියේ 2010 පෙබරවාරි 04 දින රඹුක්කන පොලිස් වසමේදී ගිනි අවියකින් වෙඩි තබා, අත්බෝම්බයක් පුපුරවා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සම්බන්ධයෙන් අදාළ පුද්ගලයාට එරෙහිව කෑගල්ල මහාධිකරණයේ එක් නඩුවක් විභාග වන බව යි. 2017 ජනවාරි 08 දින රඹුක්කන පොලිස් වසමේදී වෑන් රථයකට පහර දී පුද්ගලයෙකුට තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් ද තවත් නඩුවක් විභාග වෙමින් පවතින බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

මෙම අවස්ථාවෙහිදී වින්දිතයාට එරෙහිව ශ්‍රී ලංකා පොලිසියේ කරුණු දැක්වීම් මගින් සිදුකරනුයේ අනීතික ඝාතනවලට ගොදුරු වූවන් වරදකරුවන් හෝ අපරාධකරුවන් ලෙස මාධ්‍ය තුළ නිරූපණය කර ඇති වෙනත් අවස්ථාවන්හිදී සිදුකළ ක්‍රියාවට සමාන ක්‍රියාවක් වන අතර, එය ඔවුන් නීති විරෝධී අන්දමින් ඝාතනය කිරීමේ ක්‍රියාමාර්ගයට හෝ ප්‍රචණ්ඩත්වයට එම කාරනා අදාළ නොවේ.

### 1.1 පොලීසියේ මැදිහත්වීම සහ අනීතික වෙඩිතැබීම.

2022 අප්‍රේල් 19 වන දින රඹුක්කන ප්‍රදේශයේ සිදුවූ පොලිස් වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පත් කරන ලද විද්වත් කමිටුවේ අතුරු වාර්තාවට අනුව 2022 අප්‍රේල් 19 වැනි දින පාන්දර වන විට රඹුක්කන සහ ඒ අවට පදිංචි 200ක් පමණ ජනතාව තම වාහනයට ඉන්ධන ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ඉන්ධන පිරවුම්හලට රැස්ව සිට ඇත. ඉන්ධන බවුසරය පැමිණීමට නියමිත බව ඔවුහු කල් තියා දැනගෙන තිබුණි. බවුසරය දුම්රිය ස්ථානයට පැමිණීමත් සමඟ ජනතාව ඉල්ලා සිටියේ වැඩි මිලට නොව කලින් මිලට ඉන්ධන නිකුත් කරන ලෙසයි. උද්ඝෝෂණයට හේතුව මෙයයි.

බවුසර් දෙකට සහ ඉන්ධන පිරවුම්හලට විරෝධතාකරුවන් විසින් ගිනි තැබීමේ තර්ජනයක් එල්ල වූ බව පොලීසියට නිරීක්ෂණය වී ඇති අතර විරෝධතාකරුවන් ඒ වන විටත් දුම්රිය මාර්ගයේ අවහිර වී තිබූ දුම්රියට ද හානි කිරීමේ ප්‍රබල තර්ජනයක් එල්ල කළ බවට ද පොලිසිය තර්ක කළහ. ඒ අනුව කඳුළු ගෑස් භාවිතා කිරීමෙන් පොලිසියට අවශ්‍ය වූ පරිදි පිරිස විසිරී නොයාමත් සමඟ කෑගල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.බී. කීර්තිරත්න මහතා විරෝධතාකරුවන්ට දණහිසට පහළින් වෙඩි තැබීමට නියෝග කළේය. කෙසේ වෙතත්, පහත දැක්වෙන නිලධාරීන්ගේ සාක්ෂි අනුව වෙඩි තැබීමට නියෝග කළ පරිදි ඔවුන් වෙඩි තබා නැත. ඔවුන් අත්තනෝමතික ලෙස බිමට වෙඩි තැබීමට තීරණය කර ඇත. T56 ගිනි අවි අත තිබූ සහ බිමට වෙඩි තැබූ බව කියන පොලිස් නිලධාරීන්ගේ නම් මෙසේය.

1. පොලිස් කොස්තාපල් (69336) එච්.එස්.පී. ජයකොඩි
2. පොලිස් කොස්තාපල් (29116) ජීවන් ලක්මාල් කපුකොටුව
3. පොලිස් කොස්තාපල් (90427) ජනක කුමාර

දෙපාර්තමේන්තු නියෝගවල සඳහන් පරිදි, නිලධාරියාට දණහිසට පහළින් වෙඩි තැබීමට නියෝග කළ පසු, අත්තනෝමතික ලෙස ඔහු කැමති ස්ථානයකට වෙඩි තැබීමට තීරණය කළහොත්, ඔහු පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝග කඩ කරයි.

කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි පහත සඳහන් හේතු නිසා විශ්වාස කළ නොහැක.

1. පොලිසිය විරෝධතාකරුවන්ට වෙඩි තැබූ අතර වෛද්‍ය වාර්තාවල දැක්වෙන පරිදි වෙඩි වැදී තිබුණේ දණහිසට පහළින් නොවේ.

2. මීට අමතරව, මෙම විමර්ශනය පිළිබඳව කොමිසමට සහ රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවට සහය ලබා දුන් ගිනි අවි විශේෂඥවරයා සහ අධිකරණ වෛද්‍ය විශේෂඥවරයා විසින් බිමට එල්ල කර වෙඩි තැබීම සිදු කළ බවට පොලිසිය කරන තර්කය සාවද්‍ය බව පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

පිරිස විසුරුවා හැරීමට පොලිසිය කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කර ක්‍රමක්‍රමයෙන් පිරිස විසිර යමින් තිබුණද කඳුළු ගෑස් සම්පූර්ණයෙන් අවසන් වනතුරු පොලිසිය එම ක්‍රියාමාර්ගය කරගෙන නොගිය බවද කමිටුවේ නිරීක්ෂණයට ලක්ව ඇත. එම නිසා කඳුළු ගෑස් මෙහෙයුම නතර කළ සැණින් පිරිස යළි පිරිස විරෝධතාවයට එක්වී තිබිණි. දෙපාර්තමේන්තු නියෝගවල සහ පොලිස් චක්‍රලේඛවල සඳහන් නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම වෙනුවට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කීර්තිරත්න තීරණය කර ඇත්තේ පැහැදිලිවම නිශ්චිත නොවන විශාල පිරිසකට දණහිසෙන් පහළට වෙඩි තැබීමට නියෝග කිරීමය.

ඉන්ධන බවුසර් දෙකේ ආරක්ෂාවටත්, ජනතාවට සහ දේපළවලටත් දැඩි අලාභහානි සිදුවනු ඇතැයි යන තර්ජන පිළිබඳ සාධාරණ චකිතයක් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කීර්තිරත්නගේ සිතේ තිබූ බැවින් වෙඩි තැබීමට නියෝග කළ බව පොලීසිය තර්ක කර ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් පොලිසියේ තර්ක පදනම් විරහිත බව නිශ්චිත සහ අවසාන නිගමනයකට පැමිණීමට කමිටුවට හැකි විය. මෙම උපකල්පනය තවදුරටත් තහවුරු වන්නේ මඩවල පාරේ නවතා තිබූ බවුසරයෙන් සම්පූර්ණයෙන්ම ඈත්ව සිටි විරෝධතාකරුවන් කිහිප දෙනෙකුට ද වෙඩි වැදී තුවාල සිදු වූ බව නඩු විභාගයේදී අනාවරණය වීමත් සමඟ බව කමිටුව සඳහන් කර ඇත.

### 1.2 කුරුවිටගේ දොන් චමින්ද ලක්ෂාන්ගේ මරණ පරීක්ෂණ වාර්තාව

කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විශේෂඥ වෛද්‍ය එන්.ඒ.එස්.පී. විජේරත්න මහතා කුරුවිටගේ දොන් චමින්ද ලක්ෂාන්ගේ මරණ පරීක්ෂණ වාර්තාවේ දක්වන පරිදි සිදුවී ඇති තුවාලවල ස්වභාවය පහතින් උපුටා දක්වා ඇත. එමෙන්ම චමින්ද ලක්ෂාන් ගේ මරණය ට හේතූ ලෙස පහත සඳහන් කාරණා වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත.

1. ලේ ගැලීම නිසා සිදු වූ කම්පනය
2. උදරයේ සහ ශ්‍රෝණි ප්‍රදේශයේ රුධිර වාහිනී, මාංශපේෂී සහ අතුනු බහන්වලට සිදු වූ තුවාල
3. ගිනි අවියකින් පිටවුණු උණ්ඩය

**Injuries**

1) Fresh perforated laceration, 6.5cmx3cm in greatest dimension, spindle shape, obliquely situated (about 40 degree angle to the horizontal plane) over the front of the abdomen across the midline. The upper end of the wound is situated 7cm below and 2cm to the right from the umbilicus. There was no burning, blackening or tattooing around the skin of the injury. The distance from the upper end of the wound to the right heel was 92cm. There was shelving of the upper end and undercutting at the lower end. The wound extended as an oblique tract across the soft tissues of the abdominal wall. There was a full thickness elongated laceration of the rectus muscle, 9cmx5cm in greatest dimension, obliquely placed. The peritoneal cavity contained about 300ml of liquid blood. Transection of the sigmoid colon with laceration of the mesentery was observed about 12cm proximal to the recto-sigmoid junction. There was laceration of inner hip muscles and internal iliac blood vessels on the left side. A compound, comminuted depressed fracture was observed on the left iliac bone. Four metallic foreign bodies were recovered from the base of the above fracture.
2) Fresh, circular shape perforated laceration, 1.5cm diameter, situated over the right hip region. It is situated 15cm below and 12cm to the right from the umbilicus. The distance from the center of the wound to the right heel was 89cm. It was surrounded by an abraded margin. The wound then extended in a form of a tract obliquely downwards and medially through the sub-cutaneous tissues in to the superficial muscles of the right hip.
3) Fresh oval shape perforated laceration, 1cmx0.6cm, situated over the right upper thigh. It is situated 17cm below and 11cm to the right from the umbilicus. The distance from the center of the wound to the right heel was 83cm. It extended obliquely into the sub-cutaneous tissue level.

**(Injuries cont. in Annexure 1)**

Dr. N.A.S.P. WIJERATHNA
MBBS, DLM, MD (Forensic Medicine)
SLMC Reg. No. 17046
Consultant JMO
DGH Kegalle.

20. මරණයට හේතුව සහ අනෙකුත් අදාළ මත
Cause of death and other relevant opinion

**1a – Haemorrhagic Shock**
**1b – Injuries to blood vessels, muscles, and bowels of the abdomen and pelvis**
**1c – Discharged bullet of a Firearm**

**<u>Other opinions:</u>**

1. Injury no 1 is consistent with an entry wound caused by a bullet from a rif entered the body at an angle (Oblique discharge).
2. Direction taken by the bullet is from right to left and downwards when the
3. Range of fire is distant. However presence of clothing and intermediate ob estimation of range of fire.
4. Category of hurt of injury no 1 is fatal in the ordinary cause of nature.
5. Injuries no 2-8 are Non-grievous in nature.
6. Injuries no 2-8 could be caused by fragmentation of the projectiles from the ejected from intermediate objects.


Post-Mortem register Serial Number } KG 283/04/2022

Date

Signature, Qualifications and Designation of Medical Officer.

**1.3 චමින්ද ලක්ෂාන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණයේ නිගමන අර්ථ නිරූපණය**

පරිවේශනීය සාක්ෂි, සිද්ධිය වූ ස්ථානයේ දර්ශන වින්‍යාසය පිළිබඳ අතීත විශ්ලේෂණය සහ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ සොයාගැනීම් මත පදනම්ව, මියගිය පුද්ගලයා ඉන්ධන පිරවුම්හල සහ අතුරු පාර වෙන් කරන කම්බි දැල් වැටට පිටුපසින් ඉන්ධන පිරවුම්හලේ අනෙක් පැත්තේ රැඳී සිට ඇත. මියගිය අයගෙන් පොලිසියට තර්ජනයක් නොවීය. මියගිය පුද්ගලයාට ඉන්ධන පිරවුම්හල/ප්‍රධාන මාර්ගය පැත්තෙන් හෙවත් කම්බි දැල් වැටේ අනෙක් පැත්තෙන් කෙළින්ම වෙඩි තබා ඇති බව ද පෙනෙන්නට තිබේ. එබැවින් ඉහත සඳහන් හේතු මත පොලිස් නිලධාරියා මියගිය පුද්ගලයාට වෙඩි තැබීමට සාධාරණ හේතුවක් නොමැති බව කමිටුව අවධාරණය කර ඇත.




*(අපරාධ ස්ථානයේ ගූගල් සිතියමක්)*

මියගිය පුද්ගලයාට වෙඩි තැබීමේ නීත්‍යානුකූලභාව පොලීසියට තහවුරු කළ නොහැකි බව කමිටුව නිරීක්ෂණය කරයි.

ජනකාය විසුරුවා හැරීමේ මෙහෙයුමක අවසාන විසඳුම ලෙස ගිනි අවි භාවිතයේදී පොලිස් නිලධාරීන් නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බව ද, කුරුවිටගේ දොන් චමින්ද ලක්ෂාන්ගේ මරණය බලය ඉක්මවා යමින් පොලිසිය කටයුතු කිරීමෙන් ලැබුණු ප්‍රතිඵලයක් බව ද, විශේෂයෙන්ම, මියගිය පුද්ගලයා විසින් පොලිස් නිලධාරීන්ට තර්ජනයක් සිදුකර නොමැති අවස්ථාවක පොලිස් නිලධාරීන්ට සහ පොලිසියට මෙම මරණය නීත්‍යානුකූලව සාධාරණීකරණය කළ නොහැකි බව ද කමිටුව වාර්තා කළේය.

විරෝධතා භූමිය ආසන්නයේ මිනිසුන්ට වෙඩි වැදී ඇති වූ තුවාල අනුව, විශේෂයෙන් පිටුපස සිට ඉදිරියට වෙඩි වැදී ඇති අතර, පොලිස් නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි බලයක් පාවිච්චි කර ඇති බව පෙන්නුම් කරයි.

**1.4 සිද්ධිය විමර්ශනය කරන නිලධාරීන්ගේ ස්වාධීනත්වය ගැන ඇති වූ සැකය**

රඹුක්කන සිද්ධියේදී පොලීසිය කටයුතු කරන ලද ආකාරය ගැන සොයා බැලීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස්ගේ ප්‍රධානත්වයෙන් ස්වාධීන පරීක්ෂණ

මණ්ඩලයක් පත් කර ඇත. එහි සාමාජිකයින් වූයේ,

- ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යංශයේ ලේකම් එස්.ටී. කොඩිකාර
- මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එම්.එස්.පී. සූරියප්පෙරුම
- ආරක්ෂක අමාත්‍යාංශයේ නීති උපදේශක මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ඊ.එස්. ජයසිංහ යන අයයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පෙන්වා දුන්නේ, රඹුක්කන වෙඩි තැබීමේ සිද්ධිය හා සබැඳිව පොලීසියේ ක්‍රියාකලාපය පිළිබඳව සොයා බැලීමට පත්කර ඇති ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් සියලුදෙනා රාජ්‍ය ආරක්ෂක අංශයේ අය බව යි. එවැනි මණ්ඩලයක් ස්වාධීන මණ්ඩලයක් නොවන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණය කර තිබුණි.

නීතියේ ආධිපත්‍යය සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වය සහතික කිරීම සඳහා විශ්‍රාමික විනිසුරුවරයෙකු, ජනාධිපති නීතිඥවරයෙකු, සිවිල් සමාජයේ සාමාජිකයෙකු වැනි රාජ්‍ය ආරක්ෂක අංශයට සම්බන්ධ නොවන වෙනත් පුද්ගලයින් පත් කරන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව පොලිස්පතිවරයාට සහ ආරක්ෂක අංශ වෙත දැනුම් දුන්නේය.

රඹුක්කන සිද්ධිය සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදුකිරීම සඳහා අවිස්සාවේල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වසන්ත කන්දෙවත්තගේ ප්‍රධානත්වයෙන් නිලධාරීන් 20 දෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ කණ්ඩායමක් පත්කර තිබුණි.

### 1.5 නඩුවේ ආරම්භක තත්වය (නඩු අංකය බී/2424/22)

රඹුක්කන ප්‍රදේශයේ 2022.04.19 දින සිදු වූ උද්ඝෝෂණය අතරතුරදී චමින්ද ලක්ෂාන් මිය යාම, පිරිසක් තුවාල ලැබීම හා දේපළවලට අලාභහානි සිදුකිරීම සම්බන්ධයෙන් පොලිසිය 2022.01.20 දින බී වාර්තා දෙකක් මගින් කෑගල්ල ගරු මහේස්ත්‍රාත් වාසනා නවරත්න මැතිනිය වෙත කරුණු වාර්තා කර ඇත.

ඉන් එක් බී වාර්තාවක් මගින් දේපළ හානි කිරීමට අදාළව සැකපිට වයස අවුරුදු දහ අටක පාසල් ශිෂ්‍යයෙකු වූ පතිරණ මුදියන්සේලාගේ කවීෂ නවීන් ගුණතිලක ඉදිරිපත් කර පොදු දේපළ පනත ඇතුලුව චෝදනා කීපයක් යටතේ කරුණු වාර්තා කර තිබිණි. ඔහු වෙනුවෙන් නීතිඥ චමින්ද අතුකෝරාල මහතා පෙනී සිටි අතර සැකකරුට ඇප ලබා දෙන ලදි.

සිවිල් නීති කඩකිරීමේ ක්‍රියාවන්ට දඬුවම් කිරීම සඳහා සාමාන්‍ය අපරාධ නීති භාවිතා කිරීම මගින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය විය හැකි අතර විරෝධතා දැක්වීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ නීත්‍යානුකූල අරමුණ අනුව එවැනි අවස්ථා සලකා බැලිය යුතුය. පෙට්‍රල්, ඩීසල් වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම ප්‍රමාද කිරීමට එරෙහිව ජනතාව විරෝධතාවයේ නිරත වූ මෙම අවස්ථාවේදී, පොදු දේපළවලට හානි කිරීම සම්බන්ධයෙන් යම් චෝදනාවක් එල්ල කිරීමේදී එවැනි හානියක් සිදුවූයේ කුමන සන්දර්භයක් තුළද යන්න සහ මහජන යහපත වෙනුවෙන් නඩු පැවරීම අවශ්‍යද යන්න සැලකිල්ලට ගත යුතුය. සැකකරුවන් හඳුනා ගැනීම සහ පොදු දේපළවලට එවැනි හානි සිදුකිරීමේදී ඔවුන් ඉටුකළ කාර්යභාරය ද සාක්ෂි ලබා ගැනීමේ අදියරේදී සලකා බැලිය යුතුය. නීතියෙන් නියම කර ඇත්නම්, අවශ්‍ය සහ සමානුපාතික නම් මිස, මහජන විරෝධතාවක සන්දර්භය තුළ සිදු කරන ලද සිවිල් නීති කඩකිරීමේ ක්‍රියාවන් සඳහා අපරාධ නීතිය යටතේ කිසිවෙකු වගවීමට ලක්කළ යුතු නොවේ.

අදාළ ගැටුම සම්බන්ධව සියලු ස්ථාන පරීක්ෂණ ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් සිදු කෙරිණ. මේ සඳහා පොලිස් නිලධාරීන් හා සීයකට අධික නීතීඥවරුන් සහභාගි වූ අතර ස්ථාන පරීක්ෂණය රාත්‍රී හත පමණ වන තෙක් පැවතිණි. සිද්ධි මාලාවේ විවිධ අවස්ථා ඇසින් දුටුවන් කීප දෙනෙකු ස්ථාන පරීක්ෂණයේදී ගරු මහේස්ත්‍රාත්තුමිය වෙත ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ප්‍රකාශ ලබා දුන්හ.

අදාළ ගැටුම සිදු වූ ස්ථානයන්හි සීසීටීවී කැමරාවන්ට අලාභහානි සිදු වී තිබූ බව මහේස්ත්‍රාත්තුමියගේ නිරීක්ෂණයට භාජනය වී ඇති අතර විසිරී තිබූ ලේ පැල්ලම්ද, අපරාධ ස්ථානද, ගින්නට බඳුන් වී තිබූ ත්‍රීරෝද රථයද ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් වැඩිදුර නිරීක්ෂණයට ලක්කරන ලදී.

ස්ථාන පරීක්ෂණය සඳහා ඉල්ලීමක් කරමින් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බී වාර්තාවේ දක්වා තිබූ දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තිය යටතේ වූ වරදක් කරන ලදැයි වූ චෝදනාව (නොසැලකිලිමත් ලෙස සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ වරද - උපරිම දණ්ඩනය වසර පහක බරපතල වැඩ සහිත සිර දඬුවමකි) ගරු මහේස්ත්‍රාත්තුමිය ස්ථාන පරීක්ෂණයේ යෙදී සිටින අතරවාරයේ පොලිසිය විසින් ටිපෙක්ස් කර මකා දමා තිබෙනු ගරු අධිකරණයේ නිරීක්ෂණයට භාජනය වී තිබුණි.

මෙම අවස්ථාවේදී, පොලිසියේ හැසිරීම මහේස්ත්‍රාත්වරියගේ අවධානයට යොමු කරන ලද අතර ඇය වහාම අදාළ නිලධාරීන්ට අනතුරු ඇඟවූවාය. අධිකරණය භාරයේ තිබූ එම බී වාර්තාව අධිකරණයේ අවසරයකින් තොරව වෙනස් කිරීම සම්බන්ධයෙන් පොලිසිය ගරු අධිකරණයෙන් සමාව අයැද සිටින ලද අතර ඒ සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට වාර්තා කර අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගන්නා බවට පොරොන්දු වූහ.

මෙම මූලික සිද්ධාන්ත හෝ නොදන්නා පොලිස් නිලධාරීන් මෙතරම් බරපතල සිද්ධියක් සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්නේදැයි යන්න තමන්ට සැක සහිත බව ප්‍රකාශ කරමින් දැනට පරීක්ෂණ පවත්වන පොලිස් කණ්ඩායමෙන් මෙම පරීක්ෂණ ඉවත් කොට වෙනත් පොලිස් කණ්ඩායමක් වෙත මෙම පරීක්ෂණ පැවැත්වීමට නියෝග කරන ලෙස නීතීඥවරු ගරු අධිකරණයෙන් ඉල්ලා සිටියහ.

තවද දැනටමත් අදාළ සිද්ධියේදී පොලිසිය අවම බලය පාවිච්චි කර ඇති බව පිළිගෙන ඇති නිසා වෙඩි තැබීමේ නියෝගය නිකුත් කළ පොලිස් නිලධාරියා හා වෙඩි තැබීම කළ පොලිස් නිලධාරීන් මරණකරු සම්බන්ධයෙන් වූ මරණ පරීක්ෂණයේ සාක්ෂිකරුවන් ලෙස ඇතුළත් කරන ලෙසද නීතීඥවරු ඉල්ලා සිටියහ.

### 1.6 සිදුවීම ඇසින් දුටු අය අධිකරණය ඉදිරියේ දුන් සාක්ෂි

චමින්ද ලක්ෂාන් ගේ මරණය සම්බන්ධව පැවති මහේස්ත්‍රාත් පරීක්ෂණය රඹුක්කන මහේස්ත්‍රාත් වාසනා නවරත්න ඉදිරියේ පැවැත්වූ අවස්ථාවේදී සාක්ෂි දුන් සාක්ෂිකරුවෙක් (දෙවන සාක්ෂිකරු ලෙස මාධ්‍ය වාර්තාවල සඳහන් වූ අතර නම දැනගත හැකි වූයේ නැත) අධිකරණය හමුවේ මෙසේ කීවේය.

"දවල් 2ට විතර මම තෙල් ගහන්න ගියා. ඒ වෙලාවේ තෙල් ඇවිල්ලා තිබුණේ නැහැ. එතැන උද්ඝෝෂණයක් තිබුණා. මමත් ඒකට සහභාගී වුණා. උද්ඝෝෂණ කළ පිරිස හිටියේ බවුසර් දෙක තිබුණ තැන. පොලීසිය මුලින් හිටියේ කෑගල්ල පාරේ එක පැත්තකට වෙන්න වගේ. ඊට ඉස්සරහින් පොලිස් නිලධාරීන් තුන් දෙනෙක් ත්‍රීවිල් එකකට මුවා වෙලා වගේ හිටියා. මම හිටියේ උද්ඝෝෂණ කරුවොයි පොලීසියයි අතර මැද.

''ත්‍රිරෝද රථයකට මුවා වෙලා හිටි පොලිස් නිලධාරීන් අතර රාජ්‍ය ලාංඡනයයි තරු දෙකකුයි කරේ පැළඳගෙන හිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුත් හිටියා. ටික වෙලාවකින් සිවිල් ඇඳගත්තු තුන්දෙනෙක් එතැනට ආවා. ඒ අය කවුද කියලා මම දන්නේ නැහැ. ඒ තුන්දෙනා පොලීසිය හිටපු පැත්තට ගල්වලින් ගැහුවා. එතකොටම අර ජ්‍යෙෂ්ඨ නිලධාරියා 'කඳුළු ගෑස් ගහන්න' කිව්වා. ඊට පස්සේ ත්‍රිරෝද රියට මුවා වෙලා වගේ හිටපු පොලිස් නිලධාරීන් තුන් දෙනා කඳුළු ගෑස් ගැහුවා.

''එතකොටම ජ්‍යෙෂ්ඨ නිලධාරියා කිව්වා 'මේක හරියන්නේ නැහැ ඕකුන් වෙඩි තියලා මරපන්' කියලා. එතකොටම පොලීසිය වෙඩි තිබ්බා. මම දිව්වේ මඩවල පාර දිගේ. මා එක්ක තවත් කට්ටිය ගොඩක් දිව්වා. පොලීසිය අපි පිටිපස්සේ පන්න පන්නා වෙඩි තිබ්බා. පොලීසිය වෙඩි තිබ්බේ දුවන අපිට. මම දුවලා ගිහින් පන්සලක් ඇතුළට ගිහින් නතරවුණා.''

### රඹුක්කන පදිංචි බී. ඉන්දික මහතාගේ ඇසින් දුටු සාක්ෂිය

"පාන්දර ඉඳන් විරෝධතාවයේ යෙදිලා හිටිය පිරිස් රඹුක්කනින් පාර වසා දැමුවා. උද්ඝෝෂකයන්ට වුවමනා වුණේ, මෙවැනි අවස්ථාවක අමානුෂික ලෙස අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් වන ඉන්ධන මිල ඉහළ දැමීම ගැන ඔවුන්ගේ විරෝධතාව ප්‍රකාශ කරන්න. මාර්ගය හරස් කළත් ගිලන් රථවලට හා පාසල් රථවලට යන්න

ඉඩ දුන්නා. අපි ඉල්ලුවේ තෙල් මිල අඩු කරන්න කියලා විතරයි. ඉන්පසුව තෙල් බවුසරය පැමිණියාට පස්සෙ අපේ ඉල්ලීම වුණේ පරණ මිලට ඉන්ධන ලබා දෙන්න කියන එක. සමුපකාර සේවා ඉන්ධනහල වෙත පැමිණි තෙල් බවුසරය සමුපකාර පරිපාලනය විසින් හිතාමතා ප්‍රමාද කළා කියලා උද්ඝෝෂකයෝ විශ්වාස කළා. එම උද්ඝෝෂණයේ ජාති භේදයක් තිබුණේ නැහැ. රඹුක්කන රෝහලේ වෛද්‍යවරු පවා උද්ඝෝෂණයට එකතු වුණා. සාමකාමී උද්ඝෝෂණයට රඹුක්කන පොලිසියත් සහාය දැක්වූවා. දෙවැනි වරටත් තෙල් බවුසරයක් පැමිණියාට පසු අපේ ඉල්ලීම අපි පොලිසියට ඉදිරිපත් කළා. පොලිසිය අපේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළාට පසු අපි බවුසරය මඟින් දුම්රිය මාර්ගය හරස් කරලා නැවතවරක් උද්ඝෝෂණය පටන් ගත්තා. බවුසරයට අපි පූර්ණ ආරක්ෂාව ලබා දුන්නා. අඩුම ගානේ සිගරැට් එකක් පත්තුකරගෙන බවුසරය ගාවට කිසිම කෙනකුට එන්න දුන්නේ නැහැ. ගමේ කාන්තාවන් පැමිණ උද්ඝෝෂකයන්ට අවශ්‍ය ආහාර පාන ඒ ස්ථානයේම සකස් කළා. ඒ ආහාරවලින් කොටසක් අපි රඹුක්කන පොලිසියේ නිලධාරීන්ටත් ලබා දුන්නා. බවුසරයේ රියැදුරාට පවා කෑම ලබා දුන්නේ උද්ඝෝෂකයන්. කඳුළු ගෑස් ගහන්න පටන් ගත්ත අවස්ථාවේදී අපි හිටියේ කෑම සකසමින්."

"උඹලගෙ උණ්ඩ වෙනුවට අපිට තියෙන්නේ රේල් පාරේ කළුගල්. එහෙම කියාගෙන තමයි අරගලයේ නිරතව සිටි පිරිස් කඳුළුගෑස්වලට විරුද්ධව පොලිසියට ගල් මුල් ප්‍රහාර එල්ල කළේ. ඒ අවස්ථාවේදී පිරිස් විසුරුවාහරින්න විශේෂ කාර්ය බළකායත් කැඳවා තිබුණා. ඔවුන් ඉවක් බවක් නොමැතිව උද්ඝෝෂකයන්ට පහර දුන්නා. ඒ පහර දුන් අවස්ථාවේ වෙඩි තැබීමක් සිදුවුණේ නැහැ. වෙඩි තැබීමක් සිදුවුණේ පහරදීමෙන් පසුව. උද්ඝෝෂකයන් දිව්වේ ප්‍රධාන පාර දිගේ. ඒ කියන්නේ පින්නවල දිහාට. උද්ඝෝෂණයේදී වෙඩි වැදී මියගිය පුද්ගලයා පින්නවල දෙසට නොවේ දිව ගියේ. ඔහු දිවගියේ ඉන්ධන පිරවුම්හල දෙසට. එලෙස දිවගොස් ඉන්ධන පිරවුම්හල අසල වැටී සිටියදී තමයි ඔහුගේ බඩට පොලිසිය වෙඩි තිබ්බේ. ඒ පිළිබඳ ඇසින් දුටු සාක්ෂි තිබෙනවා. පොලිසිය පළමුව ඉන්ධන පිරවුම්හලේ සී.සී.ටී.වී. කැමරා පද්ධතිය විනාශ කළා. ඉන්පසුව ඔවුන් උත්සාහ කළේ ඉන්ධන පිරවුම්හලට ගිනි තබා එහි වරද උද්ඝෝෂකයන් පිට පටවන්න."

**සිදුවීම ඇසින් දුටු වලිමුනිදේවගේ සුසන්ත අනුර කුමාර අධිකරණය ඉදිරියේ දුන් සාක්ෂි**

"කිරිසුද්දා හෙවත් චමින්ද ලක්ෂාන්ගේ බයිසිකලය තිබුණේ හයවෙනියට. හරියටම වෙඩි තිබ්බෙ ෂෙඩ් එක ළඟ ඉඳන් මීටර් 20ක් දුරින්. තාප්පයෙන් එහා පැත්තේ ත්‍රීවීල් ගිනිගත්තා. ඊටපස්සෙ වෙඩි තියන්න පටන් ගත්තා දිගටම. ඊටපස්සෙ කඳුළු ගෑස් ගැහුවා."

**රඹුක්කන වෙඩි තැබීම අතරතුර ගිනි තබන ලද ත්‍රීරෝද රථ හිමියාගේ සාක්ෂිය**

"උද්ඝෝෂණය ආරම්භ කළේ මම. අපි ටවුන් එකේ ත්‍රීවීල් පාක් එකේ හතර දෙනෙක් එකතුවෙලා තමයි උද්ඝෝෂණය ආරම්භ කළේ. සෙනඟ ටිකෙන් ටික එකතු වුණා. අපි හිතන්නෙම නැති විදියට ලොකු සෙනඟක් එකතු වුණාට පස්සෙ අරගලයට නායකත්වය දෙන්නට අපටම සිදුවුණා. දහවල් වෙනකම් පොලිසිය සිටියේ උද්ඝෝෂකයන් සමඟ. ඊට පසුව කෑගල්ල පොලිසියේ ඉහළ පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු උද්ඝෝෂණ භූමියට පැමිණියා. දෙවැනිවරට ඉන්ධන බවුසරය පැමිණියාට පසු මම ස්ථානාධිපතිවරයා මුණගැසී ඉන්ධන බවුසරය වරකාපොළ සඟවා තබාගෙන මිල ඉහළ දැම්මාට පසු මෙතැනට රැගෙන ඇවිත් බව පවසා පැරැණි මිලටම ඉන්ධන නිකුත් කරන ලෙස ඉල්ලා සිටියා. 'මට උපදෙස් දෙන්න උඹ කවුද?' කියලා ස්ථානාධිපතිවරයා මට තර්ජනය කළා. ඒ අවස්ථාවේදී එම ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපතිවරයා 'උඹ ත්‍රීවීල් එකක් නේද දුවන්නේ? පරිස්සම් වෙයන්. මේ උද්ඝෝෂණ හැමදාම කරන්න බැහැ,' කියලා මට තර්ජනය කළා. උද්ඝෝෂකයන්ට පහරදීමක් සිදුවෙයි කියලා මට තේරුණා. මම මගේ අයියගේ කඩේට ගිහිල්ලා ඇඳගෙන හිටපු ටීෂර්ට් එක ගලවලා අලුත් ටීෂර්ට් එකක් ඉල්ලගත්තා. ඒක ඇඳගෙන මම මගේ ත්‍රීවීල් එක නතර කරලා තිබුණු රේල්වේ ක්වාටර්ස්ගාවට ආවා. ඒ අවස්ථාවේදී ඒ ආසන්නයේ ඇති බුදු පිළිමය ගාවට ආපු රඹුක්කන පොලිසියේ ස්ථානාධිපතිවරයා කළු ඇඳුමින් සැරසුණු නිලධාරීන් දෙදෙනකුට මාව පෙන්නුවා. ඒ අය අතේ තිබ්බේ කොට තුවක්කු. ඔවුන් ත්‍රීවීල් එක පැත්තට එද්දි මම පැනලා දිව්වා. පරණ ක්වාටර්ස් එක පිටිපස්සෙන් ඇවිත් ත්‍රීවීල් රථයට ආසන්නයේ ඇති කොස් ගහක් මුල වාඩි වුණා. ඒ වෙද්දි මගේ අයියා එයාගෙ ගෙදර ඉඳලා ජනේලයෙන් සිදුවෙන්නේ මොකක්දැයි කියලා බලා ඉඳලා තියෙන්නේ. කෙහොම හරි නිලධාරීන් පස්දෙනකු එතැනට පැමිණියත්, පළමුව ආපු දෙන්නා තමයි ඉන්ධන පුරවන ස්ථානයේ ටෙන්ට් එක පොඩ්ඩක් අයින් කරලා ඒකට ලයිටරයකින් ගිනි

තිබ්බේ. ත්‍රීවීල් එකේ වහල සම්පූර්ණයෙන් ගිනි ගන්න තෙක් මම ඒ ස්ථානයේ හිටියා. අන්තිමට බලාගෙන ඉන්න බැරි හින්දා මම තාප්පෙන් පැනලා ස්ටේෂන් එකේ ගල්වල හරියට ගිහින් නිදිය ගත්තා. පැය දෙකකට විතර පස්සේ අයියා කතා කරලා කිව්වා ත්‍රීවීල් එකේ ගන්න දෙයක් ඉතිරිවෙලා නැහැ කියලා."

**1.7 මිය ගිය චමින්ද ලක්ෂාන් ගේ බිරිඳ ගේ අදහස්**

"උසාවියෙන් සාධාරණයක් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒත් වෙයිද දන්නේ නැහැ. මම ළමයි දෙන්නාගේ ඉදිරි අනාගතයට වන්දි මුදලක් ඉල්ලනවා. අනිවාර්යයෙන්ම ඒක වෙන්න ඕනෑ. මගේ මහත්තයාගේ වටිනාකම එයාලට කොහොමත් දෙන්න බැරි වෙයි.''

චමින්ද ලක්ෂාන් ගේ බිරිඳ වන සමන් ප්‍රියංගනී මහත්මිය 2022 ජූලි මස 18 වන දින කෑගල්ල දිසා අධිකරණයේදී විත්තිකරුවන් 11දෙනෙකුට එදිරිව නඩුවක් ගොනු කර රු. මිලියන 50ක වන්දියක් නඩු ගාස්තු සහ ගරු අධිකරණයට සුදුසු යැයි හැගෙන වෙනත් සහ වැඩිමනක් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය.

## 2. පොලිස් වෙඩි පහරින් බරපතළ තුවාල ලැබූ කේ.ඩී. අශේන් චාමිකර සමරනායක

ඉහල ඇත්වටේ වත්ත, කිරිවල්ලපිටිය, රඹුක්කන ජීවත් වන 24 හැවිරිදි අවිවාහක කෝමන්ගොඩගේ දොන් අශේන් චාමිකර සමරනායක මහතා දම්රෝ ආයතනයේ සේවකයෙකු ලෙස කටයුතු කර ඇත.

19 වනදා සිදුවීම ගැන අශේන් ප්‍රකාශ කරන්නේ, එදින උදෑසන 7.45ට පමණ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට නිවසින් පිටත්ව ගිය බවයි. නමුත් රඹුක්කන නගරයේ ඇති වී තිබූ නොසන්සුන්තාවය මත ටයර් ගිනි තබා මාර්ග සියල්ලම වසා තිබුණු නිසාතම මිතුරෙකු සමග සිදුවීමට මුලික වූ ඉන්ධන පිරවුම්හල වෙතට ගොස් ඇත. පෙ.ව. 9.30ට පමණ එතනින් පිටත්ව නිවසට පැමිණ නැවතත් මිතුරන් සමග පෙ.ව 11.00ට පමණ රඹුක්කන නගරය වෙත ගොස් ඇත. ඔහු පවසන ආකාරයට ඒ වනවිට උදෑසනට වඩා රැස්ව සිටි පිරිසේ වැඩි වීමක් තිබුණු බවත්. පොලීසිය ඉන්ධනහල අසලට පැමිණ සිට ඇති බවත් ය. ඉන් පසුව, ගිනි තැබීමක් හෝ යමක් වේ යැයි සිතා ඉන්ධනහලේ සිටි පිරිස ඉවත් කර ලණු ඇද එයට ඇතුල් වීම සිටි පිරිස වළක්වා ඇත. එහි ඉන් පසු ඇතුළත රැඳී සිට ඇත්තේ භික්ෂූන් වහන්සේලා කිහිපනමක් පමණි. ඉන්ධනහල අසල සිට පා ගමනින් වටරවුම දෙසට ගොස් නැවත පැමිණෙන විට රේල් පාර හරස්වන පරිදි තෙල් බවුසර් නවතා තිබුණු බවත්, එම නිසා දුම්රිය ද නවතා තිබූ බවත් ඔහු පවසයි. නැවතත් ප.ව. 2.30 පමණ වන විට ඔහු නිවස බලා පැමිණ ඇති අතර ඉන් පසුව යුද හමුදාවේ සේවය කරන ඔහුගේ මිතුරෙකුගෙන් දුරකතන ඇමතුමක් ලැබී ඇත. එහිදී ඔහු කියා ඇත්තේ රඹුක්කන නගරයේ උදෑසන සිට ඇති වූ තත්වය උත්සන්න වී ඇති බවත් පොලිසිය පිරිස් පලවා හැරීමට කඳුළු ගෑස් හා ප්‍රහාර එල්ල කරමින් සිටින බවයි. ඒ වන විටත් ඔවුගේ සොහොයුරා වන ආසිරුමය සමරනායක සිද්ධියට මූලික වූ ඉන්ධන පිරවුම්හලට යාබදව තිබෙන කාගිල්ස් ෆුඩ් සිටියේ සේවය කරමින් සිට ඇත. ඔහුව සම්බන්ධ කර ගැනීමට අශේන් දුරකථන ඇමතුම් කිහිපයක් ලබා ගත්තද හැකියාව ලැබී නොමැති අතර ඉන් පසුව අශේන් නැවතත් තම මිතුරෙකු සමග සොහොයුරාව රැගෙන එන අරමුණින් ප.ව. 3.45ට පමණ රඹුක්කන නගරය වෙත යතුරුපැදියෙන් පිටත්ව ගොස් ඇත.

යතුරුපැදිය මිතුරාට ලබා දී සහෝදරයා රැගෙන ඒමට පාගමනින් ගොස් ඇති අතර ඉදිරියට ගමන් කරන අතරතුර එක් වරම පොලීසියෙන් කදුළු ගෑස් හා ගල් ප්‍රහාර කිහිපයක් අශේන් ගමන් කර දෙසට එල්ල කර ඇත. ඉන් පසු ඔහු නැවත මුහුණ සෝදාගෙන ප්‍රධාන මාර්ගයෙන් ගමන් ගන්නා විට ගල් ප්‍රහාර එල්ල වන නිසා දුම්රිය මාර්ගය හරහා ගමන් කර ඇත. ඒ අවස්ථාවේ දුම්රිය මාර්ගයේ ගමන් කර ඇත්තේ ඔහු පමණක් වන අතර පොලිසිය විසින් ඔහු දෙසට ගල් ප්‍රහාර එල්ල කිරීමට පටගෙන ඇත. අශේන්දගල් ප්‍රහාර කිහිපයක් පොලීසිය දෙසට එල්ල කර ඇත. එසේ සිදූ වී තත්පර කිහිපයක් ඇතුළත ඔහුගේ හිස අසලින් ගිනි පුපුරක් සේ වෙඩි උණ්ඩයක් ගමන් කරනවා දැනීමත් සමග ඔහු ආපසු හැරී දිවීම ආරම්භ කර ඇත. ඒ සමග දකුණු අතට වෙඩි වැදී ඇති බවත්, ඉන් පසුවත් නොනවත්වා ඔහු ෆුඩ් සිටිය දෙසට දුවද්දී කකුලටත් වෙඩි වැදී ඇති බවත් ප්‍රකාශ කර සිටියේය. ඔහු ඉන්ධනහල අසලට වනතෙක් දුව ගොස්

ඇති අතර ඉන් පසුව ක්ලාන්ත ගතියකින් ඇද වැටීමට යන විට අසල සිටි දෙදෙනෙකු අල්ලාගෙන ඇති බව පැවසීය. එතැන් සිට සිදු වූ දේවල් ඔහුට නිශ්චිතව මතක නොමැති බව ප්‍රකාශ කළේය.

ප.ව. 04.00ට පමණ මෙම වෙඩි වැදීම සිදුවී ඇති අතර විනාඩි පහක්, දහයක් අතර කාලයකදී ත්‍රීවීලරයකින් රඹුක්කන රෝහල කරා ගෙන ගොස් ඇති අතර තත්වය බරපතළ බැවින් පසුව පෞද්ගලික වෑන් රියකින් කෑගල්ල රෝහල වෙත ගෙනගොස් ඇත.

අතෙහි අස්ථිය සම්පූර්ණයෙන්ම බිඳී ගොස් ඇති නිසා නැවත සැකසීය නොහැකි බව වෛද්‍යවරුන් පවසා තිබේ. එදින තුවාලවලට මැහුම් දැමීම හා බෙහෙත් දැමීම පමණක් සිදු කර ඇති අතර පසුදින සැත්කමක් සිදුකර තිබේ. ඔහු සතියක පමණ කාලයක් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිට ඇත. ඉන් පසු නිවසට පැමිණ දින දෙකක් පමණ සිටින විට එක් වර තුවාලයෙන් ලේ වහනය වීමත් සමග නැවත රෝහල ගත කර ඇති අතර එවර පැය 3 1/2කට අධික කාලයක ශල්‍යකර්මයක් සිදුකළ බව ඔහු පැවසුවේය. එවරද සතියක පමණ කාලයක් රෝහලේ නේවාසික ප්‍රතිකාර ලබා නිවසට පැමිණ ඇත. රෝහලෙන් දැනුම් දී ඇති පරිදි ඔහුගේ දකුණු අත සැකසීම සඳහා ශල්‍යකර්මය සිදු කිරීමට අවශ්‍ය කම්බිය තම පෞද්ගලික වියදමෙන් මිලදී ගත යුතු වී සඳහා රුපියල් 80,000ක පමණ මුදල වැය වන බව අශේන් පැවසීය. වැඩ කිරීමේ නොහැකියාව නිසා ඔහුට රැකියාව අහිමි වී ඇත.

## 3. බරපතල තුවාල ලැබූ ඩී.පී කමල් හේමජිත් කුමාර

41 හැවිරිදි ඩී.පී කමල් හේමජිත් කුමාර මහතා යෝධගම, රඹුක්කන ලිපිනයේ පදිංචි වෘත්තියෙන් පෙදරේරුවෙකි. විවාහකයෙකු වන ඔහු දෙදරු පියෙකි.

අප්‍රේල් 19 දින රඹුක්කන වෙඩිතැබීමේ සිදුවීම සිදුවන්නට පෙර ඔහු උදෑසන 10.30 ට පමණ යතුරුපැදියට ඉන්ධන ලබා ගැනීමේ අරමුණින් රඹුක්කන ඉන්ධන පිරවුම්හල වෙත පැමිණ ඇත. ඔහු ඒ අසළට ළඟා වෙද්දී පිරවුම්හලේ ඉන්ධන තිබී නොමැති බවත් එහි ඉදිරිපිට උද්ඝෝෂණයක් පැවැත්වුණු බවත් දැනගත් පසු ඔහු රඹුක්කන දුම්රිය ස්ථානයේ සේවක නේවාසිකාගාරය ඇති ස්ථානයේ සිය යතුරුපැදිය නවතා උද්ඝෝෂණය පැවැත්වුණු ප්‍රදේශයට පැමිණ ඇත. යම් වේලාවක් කමල් මහතා එතැන රැඳී සිටීමෙන් අනතුරුව ඒ අසළ තිබූ නූඩ්ල්ස් දන්සලකට ද සහභාගී වී තිබුණි. ඒ මොහොතේ දී රඹුක්කන ඉන්ධන පිරවුම්හල ප්‍රදේශයේ සිටි පොලිස් නිලධාරීන් හට ද නූඩ්ල්ස් සහ වතුර ලබා දීමට ඔහු ද සහය දක්වා ඇති අතර ඔහු පවසා සිටියේ ඉතාම සාමකාමී වටපිටාවක් තුළ ඔවුන් ක්‍රියා කළ බවයි. ඉන්පසු හවස 3.30 වන විට ඉන්ධන පිරවුම්හල අසලම සිටි පොලිස් නිලධාරීන් පිරිස එතනින් පිටව ගොස් ඇත. උද්ඝෝෂණය පවතින අතරතුර තවත් බවුසර් රථයක් පැමිණිය ද පොලීසියට බවුසර් රථ දෙකම එම ස්ථානයෙන් ඉවත් කිරීමට වුවමනාවක් තිබූ නිසා ජනතාව එයට විරුද්ධ වීමත් සමඟ තත්වය උණුසුම් අතට හැරුණු බව කමල් මහතා පවසා සිටියි.

හවස 4.00 පමණ වන විට ජනතාව කලබල වීමත් සමග පොලිසිය අහසට වෙඩි තියා කඳුළු ගෑස් ප්‍රහාර ද එල්ල කර ඇත. ඒ මොහොතේ පිරිස විසිරී ගොස් තිබුණද වෙඩි තැබීම් සහ කඳුළු ගෑස් ප්‍රහාරයන් නොනැවතී එල්ල කළ බවත්, ත්‍රීරෝද රථයකට ගිනි ඇවිලී තිබෙනු තමන් රේල් පාරේ යන විට නිරීක්ෂණය කළබව කමල් මහතා පවසයි. ගිනි තබන ලද ත්‍රීරෝද රථය අසල ඔහුගේ යතුරුපැදිය තිබූ නිසාවෙන් එය එම ස්ථානයෙන් ඉවත් කර වෙන තැනක නවතා පස්වරු 5.45 වන විට රේල් පාර පැන ඉදිරිපස තිබූ දැලෙන් ද රිංගා එන විට ඔහුට වෙඩි වැදුණ බව ඔහු පවසයි. ඉන්පසු ඒ අසල සිටි කිහිප දෙනෙක් ඔහුව යතුරුපැදියක ආධාරයෙන් රඹුක්කන මහ රෝහලට ගෙන ගොස් ඇත. රෝගී තත්වය බරපතල බැවින් කෑගල්ල මහ රෝහලට පසුව මාරු කර තිබුණි. ඉන්පසු ඔහු රෝහලේ දින 16ක් නේවාසිකව ප්‍රතිකාර ගෙන ඇත.

මෙම සිදුවීමෙන් ඩී.පී කමල් හේමජිත් කුමාර මහතාගේ පපු ප්‍රදේශයේ සිට පෙකනි වැල දක්වා ඉතා බරපතල තුවාල සිදු වී සැත්කමකට භාජනය කරන ලදි. ඔහුගේ මහා ප්‍රාචීරයට මැහුම් යොදා තිබේ.

පෙදරේරුවෙකු වශයෙන් තමන් දෛනිකව ආදායම් උපයන්නෙකු වූ බවත් ඉහත සඳහන් රෝග ආබාධවලට ලක් වීම නිසා තමන්ට සිය දෛනික රැකියාවේ සාමාන්‍ය ආකාරයට නියැලීමට නොහැකි බවත්, වසරකට අධික කාලයක් රැකියාවේ නිරත නොවන ලෙස සහ මහන්සි වී සිදුකරන කිසිදු වැඩක නොයෙදෙන ලෙස වෛද්‍ය උපදෙස් ලැබී ඇති බවත් ය. කමල් මහතාගේ බිරිඳ රැකියාවක නොයෙදෙන නිසාවෙන් පවුලේ ආදායම් උපයන්නා වී ඇත්තේ ඔහුය. පාසල් අධ්‍යාපනය හදාරණ වයස අවුරුදු 13ක් සහ 10ක් වන කුඩා දරුවන් දෙදෙනෙක් සිටින ඔහු සහ බිරිඳ ජීවත් වන්නේ කුලී නිවසකය.

2022 ජූලි මස 18 වන දින කමල් හේමජිත් කුමාර මහතා කෑගල්ල දිසා අධිකරණයේදී විත්තිකරුවන් 11 දෙනෙකුට එදිරිව නඩුවක් ගොනු කර (නඩු අංකය M/11412/22) අනීතික, කෲර සහ ද්වේශසහගත ලෙස පැමිණිලිකරුට වෙඩි තැබීමෙන් සහ/හෝ එකී අමානුෂික ක්‍රියාව හේතුවෙන් සහ/හෝ ඔවුන්ගේ නීතිමය පැහැර හැරීම තුළින් පැමිණිලිකරුගේ,

1. ආරක්ෂා වීමේ අයිතිය උල්ලංඝනය කළ බවත්;
2. පාරේ නිදහසේ සිටගෙන සිටීමේ අයිතිය උල්ලංඝනය කළ බවත්;
3. නිදහසේ රැකියාවක් කිරීමට ඇති අයිතිය උල්ලංඝනය කළ බවත් ප්‍රකාශ කර, විත්තිකරුවන්ගේ ඉහත කී නීති විරෝධී ක්‍රියාවන් හේතුකොටගෙන පැමිණිලිකරුට සිදු වූ හානි වෙනුවෙන් රු. 20,297,000ක වන්දියක් ඉල්ලා සිටියි.

## 4. පොලිස් වෙඩි පහරින් බරපතළ තුවාල ලැබූ බුද්ධික ලක්ෂාන් එදිරිසිංහ

B 2/1, හදගම, රඹුක්කන ලිපිනයේ පදිංචි 23 හැවිරිදි වියන්නලාගේ බුද්ධික ලක්ෂාන් එදිරිසිංහ මහතා සමුද්‍ර ඉංජිනේරු (Marine Engineering) විෂය හදාරන අවසන් වසරේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකි. ඔහු තම සහෝදරිය, මව සහ පියා සමග නිවසේ ජීවත් වේ.

අප්‍රේල් 19දා එදින උදෑසන තම සහෝදරිය පාසල වෙත ඇරලවීම සඳහා ඔහු යතුරුපැදියෙන් නිවසින් පිටත්ව ගොස් ඇත. එලෙස නගරය වෙත පිවිසෙන විටදී පිරිස් එක්රැස්ව සිටින දුටු ඔහු ඒ ගැන සොයා බලන විට දැනගැනීමට ලැබී ඇත්තේ ඉන්ධන සම්බන්ධව අර්බුදයක් ඉන්ධනහල අසල හටගෙන ඇති බවයි. නැගණිය පාසල වෙත ඇරලවා බුද්ධික ද එම උද්ඝෝෂණයට සහභාගී වී ඇති අතර එය ඉතා සාමකාමී අන්දමින් සිදු වූ බව පවසයි. එසේම එම උද්ඝෝෂණයට බුද්ධික මෙන්ම ඔහුගේ දෙමාපියන්ද ඒ මොහොතේ සහභාගී වී ඇත. කිසිදු ප්‍රශ්නයක් නොමැතිව දවස ගෙවී ගිය බවත් පොලීසියද එම ස්ථානයේ රැඳීසිටි බවත් ඔහු පැවසීය.

අනතුරුව ඔහු දහවල් ආහාර ලබා ගැනීමට ප.ව 3.30ත් 4.00 අතර නිවසට පැමිණ ඇති අතර ඉන් පසු බුද්ධික ඔහුගේ ඥාති සොහොයුරෙකු සමග නැවත යතුරු පැදියෙන් රඹුක්කන නගරයට පිටත්ව ගොස් ඇත. අතරමගදී ඔවුන්ව පොලිසිය විසින් නවතා ඇති අතර නගරය වෙත යාම වළක්වා ඇත. ඉන් පසු ඔවුන් යතුරුපැදිය අතර මග නවත්වා බවුසරය දෙසට පයින් ගමන් කර ඇත. ඒ අතර පොලිසියේ හා උද්ඝෝෂකයන්ගේ හැසිරීම වෙනස්ව ඇති අතර පොලීසිය කඳුළු ගෑස් හා ගල් ප්‍රහාර උද්ඝෝෂකයන් වෙත එල්ල කරන අතර ඔවුන් ද පෙරළා එම ගල් හා කඳුළු ගෑස් කෑන් පොලිසිය වෙත ගසා ඇත. බුද්ධික ද මෙයට සෘජුවම සම්බන්ධ වී ඇති අතර ඔහු තෙල් බවුසර් දෙකෙන් පිටුපසින් තිබූ බවුසරයේ ඉදිරිපස සිට ඇත. එක්වර ආසන්නයට වැටුණු කඳුළු ගෑස් එකක් පිපිරීයාම නිස පිරිස සීසීකඩ දුවන්නට පටන් ගෙන ඇති අතර බුද්ධික මඩවල පාර දෙසට දුවගොස් ඇත. පොලිසිය ඔවුන්ලුහුබඳිමින් කඳුළු ගෑස් හා ගල් ප්‍රහාර එල්ල කර ඇත. බුද්ධික ඒ අවස්ථාවේ ප්‍රධාන පාරට මීටර් 75ක් දුරින් සිට ඇති අතර වෙඩි තබාවියැයි කිසිදු බලාපොරොත්තුවක් තිබී නැත. එක් වරම ඔහුට තම දකුණු පාදය හරහා විදුලියක් ගමන් කරනා මෙන් වේදනාවක් දැනිණි. ඒ සමගම ඔහු බිම ඇදගෙන වැටුණු අතර ඉතා අසීරුවෙන් එක පාදයකින් පනිමින් එම ස්ථානයෙන් ඉවත්ව පාරේ අනෙක් පසට මාරු වී ඇත. ඔහු එසේ සිදුකර ඇත්තේ වෙඩි වැදුණු ස්ථානයේම සිටියානම් පොලිසිය විසින් දිගින් දිගටම එල්ල කරන ප්‍රහාරයට නැවතත් ගොදුරු වන බැවිනි. පොලිසිය දිගින් දිගටම කඳුළු ගෑස් හා ගල් ප්‍රහර එල්ල කර ඇති අතර ඒ වන විට අධික ලෙස

දකුණු පාදයෙන් රුධිරය වහනය වුවත් කිසිවක් කර ගත නොහැකිව බුද්ධික පාර අයිනේ බිම වාඩි වී සිට ඇත. ඒ අවස්ථාවේදී ඔහුගේ අනික් පසෙන් පොලිස් වෙඩි පහරින් තුවාල ලැබූ අසංග නිලාන් ද වැටී සිට ඇත. එත් සමගම මුහුණු ආවරණ පැළඳි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පැමිණ අසභ්‍ය වචනයෙන් බැන වදිමින් බුද්ධිකගේ කොඳු ප්‍රදේශයට බැටන් පොලු පහර දී ඇත. ඔහු පවසන්නේ එහි කැළැල් තවමත් පවතින බවයි. එසේ පහර දීමෙන් අනතුරුව ඔවුන් "තොපි ඔතනම ඉන්න ඕනැ! තොපි විඳවන්න ඕනැ!" යි කියා එතනින් පිටත්ව ගොස් ඇත.

ඉන් පසු බුද්ධික එම ස්ථානයේම විනාඩි 20ක් පමණ සිට ඇති අතර ඒ වනවිට ඔහුගේ පාදයෙන් විශාල රුධිර ප්‍රමාණයක් වහනය වී තිබේ. එම අවස්ථවේ ඔහුගේ ඥාති සොයුරා එම ස්ථානයට පැමිණ ඇති අතර ඈතින් පැමිණි පොලිස් නිලධාරියකු සමග එක්ව ප්‍රධාන මාර්ගයේ පසෙකට ඔහු ගෙනැවිත් බිම වාඩි කරවා ඇත. එම ස්ථානයේදීත් පොලිස් නිලධාරියෙක් බුද්ධිකගේ කොඳු ප්‍රදේශයට පා පහරක් එල්ල කර බැනවැදී මාර්ගයේ මැදට යනමෙන් පවසා ඇත. එහෙත් එතන සිටි තවත් උසස් නිලධාරියෙකු මොහුගේ කකුල කැඩී ඇති නිසා එසේ නොකර එතනම රැළී සිටින ලෙස පවසා ඇත.

මෙම සිදුවීම්වලින් අනතුරුව ටික වෙලාවකින් ගිලන් රථයක් පැමිණ ඇති අතර ඥාති සොහොයුරා බුද්ධිකව එයට නග්ගවා කෑගල්ල රෝහල වෙත පිටත් කර යවා ඇත.

රොහල්ගත කිරීමෙන් පසු එදිනම රාත්‍රියේ තුවාලය පිරිසිදු කර සතියක් පමණ රෝහලේ තබාගෙන සිට ඇත්තේ තුවාල වලට විෂබීජ යාවී යැයි සිතා සුවපත් වන තුරු කැඩුණු පාදය නැවත සැකසිය නොහැකි බැවිනි. සතියකින් පසු නිවස වෙත එවා ඇති අතර දින තුනකින් නැවත පැමිණෙන ලෙස දන්වා ඇත. දින තුනකට පසු නැවත රොහල් ගතවූ ඔහුගේ පාදය ශල්‍යකර්මයකට භාජනය කර පාදයේ අස්ථියකට යකඩ කම්බියක් දමා සකසා ඇත. ප්‍රධාන අස්ථිය සම්පූර්ණයෙන් කුඩු වී ඇති නිසා එය සැකසීමට මහනුවර මහරෝහලේදී ශල්‍ය කර්මයක් සිදුකිරීමට නියමිතව තිබිණි.

සිදුවීමෙන් ඔහුගේ අධ්‍යාපනයට හා අනාගතයට ඇති වූ බලපෑම අතිමහත්ය. මාස හතරක් පමණ ඔහුගේ විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතු සම්පූර්ණයෙන්ම ඇණහිට ඇත. අනතුර වන විට ඔහු අප්‍රේල් 9දා සිට වරාය කාර්මික පුහුණුවීම් සමග එක් වීමට නියමිතව සිට ඇති අතර සිදුවීමෙන් පසු ඒ සඳහා සහභාගි වීමට නොහැකි විය. එම පුහුණුවෙන් පසු නැව් තටාකාංගනයේ පුහුණුව පැවතුණත් කිහිලිකරු ආධාරයෙන් එයට සහභාගි විය නොහැකි බව ඔහු කියා සිටියේය.

## 5. පොලිස් ප්‍රහාරයට ලක් වූ 18 හැවිරිදි පාසල් සිසුවා

ඇඹුල්අඹේ ග්‍රාමයේ ජීවත් වන පතිරණ මුදියාන්සේලාගේ කවීෂ නවීන් ගුණතිලක 18 හැවිරිදි පාසල් සිසුවෙකි. ඔහු අධ්‍යාපනය හදාරන්නේ පින්නවල මධ්‍ය මහා විද්‍යාලයෙනි.

ඔහු පවසන පරිදි අප්‍රේල් 19 වනදා රඹුක්කන ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට උද්ඝෝෂණයක් පැවතී ඇති අතර ඔහුගේ ඥාති සොහොයුරා වන බුද්ධික ලක්ෂාන් එයට සම්බන්ධ වී ඇත. ඉන්පසුව එදින දහවල් කාලයේ දී කවීෂ ද උද්ඝෝෂණය පැවති ස්ථානය වෙත ගොස් ඇත. ඒ අවස්ථාව වන විට තත්වය සාමකාමීව පැවතුණු බව ඔහු කියා සිටිනවා. දහවල් ආහාරය ලබා ගැනීම පිණිස කවීෂ සහ ඔහුගේ සොහොයුරා සිය නිවස කරා පැමිණ ඇති අතර දහවල් ආහාරය ලබාගැනීමෙන් පසු ඔවුන් නැවත උද්ඝෝෂණය පැවතුණු ස්ථානයට ගොස් ඇත. ඒ මොහොත වන විට ඉන්ධන පිරවුම්හල ප්‍රදේශයට පොලීසිය කැඳවා තිබූ බවත් ප්‍රශ්නයක් ඇති නොවේ යැයි සිතා කවීෂ සහ සොහොයුරා එම ස්ථානයට පිවිස ඇත. විනාඩි 10ක කාලයක් ගතවෙන්නටත් පෙර කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරමින් පොලීසිය විරෝධතාකරුවන් පළවාහැරීමට තැත් කර ඇති අතර කවීෂ සහ සොහොයුරා ඇතුළු විරෝධතාකරුවන් යම් පාරකට කොටු වූ බවත් එහිදීත් පොලීසිය කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළ බවත් ඔහු සඳහන් කරයි. ඒ අවස්ථාවේදී ඔහුගේ ඥාති සොහොයුරාට වෙඩි වැදී ඇත. ඉන්පසුව ඔහු වැටුණු පසු කවීෂ ඔහුව පසෙකට කර වාඩි කරවා ඇත. මොහොතකට පසු පොලීසිය එම ස්ථානයට පැමිණ කවීෂව පළවාහැර වෙඩි වැදුණු ඔහුගේ සොහොයුරා සහ තවත් පුද්ගලයෙකු හට බැටන් පොලුවලින් පහරදී වෙන ස්ථානයකට රැගෙන

ගොස් ඇත. එහි දී කවීෂ පොලිස් නිලධාරීන් හට ඔහුගේ සහෝදරයා වෙඩි ප්‍රහාරයකට ලක්ව ඇති බව ප්‍රකාශ කර ඔහුව එම ස්ථානයෙන් ගෙන ගොස් ඇත. කවීෂ ඔහුගේ සොහොයුරාව ගිලන් රථයට ඇතුළු කර තිබේ. ඉන්පසු පොලිසිය කවීෂට පහර දී පොලිස් ජීප් රථයට නංවාගෙන ඇති අතර ජීප් රථය තුළදීත් ඔහු පහරකෑමට ලක්ව ඇත. රඹුක්කන පොලීසියට රැගෙන ගිය පසු දවස් එකහමාරක කාලයක් ඔහුව එහි රඳවා තබාගැනීමෙන් පසු උසාවියට ඉදිරිපත් කර තිබුණි. ඔහුට චෝදනා රාශියක් ගොනු කර ඇති බවත් ඒ චෝදනා ගැන අදහසක් ඔහුට ලැබී ඇත්තේ උසාවියට ඉදිරිපත් කළ පසුව බවත් ඔහු පවසා සිටින අතර සැප්තැම්බර් 29දා නඩුව නැවත කැඳවීමට නියමිතව තිබිණි.

## 6. පොලිස් වෙඩි ප්‍රහාරයට ලක් වූ 14 හැවිරිදි පාසල් සිසුවෙකු වන එම්. ජී සහන් හසිත

හුරිමලුව, රඹුක්කන ලිපිනයේ පදිංචි එම් ජී සහන් හසිත තවමත් පාසල් අධ්‍යාපනය ලබන 14 හැවිරිදි සිසුවෙකි. ඔහුගේ මව එන්. පී. ශ්‍රියාලතා මහත්මිය පවසන අයුරින් අප්‍රේල් 19 සහන් හසිත පාසල් ගොස් ප.ව 2.30 ට පමණ නිවසට පැමිණ ප.ව 4.30 පමණ වන විට ඔහුගේ මිතුරෙකු වන සහිඳු රංගන සමග රඹුක්කන නගරයට පිටත් වී ඇත. රඹුක්කන ඉන්ධන පිරවුම්හල ආසන්නයේ සිදු වූ නොසන්සුන්තාව අතරතුර ඔහුට වෙඩි වැදුණු බවට ශ්‍රියාලතා මහත්මියට ආරංචි වී ඇත්තේ ප.ව 5.30 ට පමණය. ඉන් පසු ඇය කෑගල්ල රෝහලට ගොස් ඇති අතර සහන් හසිතගේ අතට සහ ඉණ ප්‍රදේශයට වෙඩි වැදී ඇති බවත්, ඔහුව ශල්‍යකර්මයකට භාජනය කර ඇති බවත් දැනගත්තාය. වෙඩි වැදීමෙන් ඔහුගේ අතේ අස්ථිය බිඳී ගොස් ඇති අතර ඉඟටිය ප්‍රදේශයේ සිදු වූ තුවාලයට ද මැහුම් හයක් යොදා ඇත. රෝහලේ නේවාසිකව දින හතරක් ප්‍රතිකාර ලබා සහන් හසිත සිය නිවසට පැමිණිය ද විටින් විට ඔහුට අපහසුතා ඇති වී තිබේ.

## 7. පොලිස් වෙඩි පහරට ලක්ව තුවාල ලැබූ සහිඳු රංගන

F 6/20, මුංකොටුව, රඹුක්කන ලිපිනයෙහි පදිංචි ඊ. ජී. සහිඳු රංගන 18 හැවිරිදි අයෙකි. ඔහු අධ්‍යාපනය හදාරා ඇත්තේ සාමාන්‍ය පෙළ දක්වා පමණි. අප්‍රේල් 19 දින ඔහු වැඩ නිමා කර සිය නිවසට පැමිණ ඒ මොහොතේදී ඔහුගේ නිවසට පැමිණ සිට සහන් හසිත සමග ප.ව 4.30ට පමණ රඹුක්කන ඉන්ධන පිරවුම්හලට ගොස් ඇත්තේ යතුරු පැදියට ඉන්ධන ලබාගැනීමේ බලාපොරොත්තුවෙනි. ඒ වන විට එහිදී නොසන්සුන්තාවය හටගෙන ඇති අතර සහන් සහ සහිඳු දෙදෙනා ද මඩවල පාරට ගොස් ඇත්තේ විරෝධතාකරුවන් ද ඒ දෙසට ඇදී යාමත් සමගය. එහිදී මුලින්ම සහන් හසිතට වෙඩි වැදුණු බවත්, ඔහුගේ තත්වය බැලීමට ගිය පසු සහිඳුට ද වෙඩි වැදුණු බවත් ඔහු පවසයි. ඉන්පසු ඔහු සිහිසුන්භාවයට පත්වී ඇත. පොලිස් වෙඩි පහරින් සහිඳුට ඇති වූ තුවාල සුව කිරීම සඳහා ඔහු ශල්‍යකර්ම දෙකකට භාජනය කර ඇත. ඔහුගේ උදරයේ අභ්‍යන්තර තුවාල සිදු වී ඇති අතර පාදයේ ලේ කැටියක් හිර වී ඇත. ඒ සඳහා ශල්‍යකර්මයන් සිදු කර ඇත්තේ කෑගල්ල සහ මහනුවර රෝහල්වලනි. මාසයක් සහ දවසක් ඔහු නේවාසිකව රෝහල් ප්‍රතිකාර ලබාගෙන ඇති අතර අවුරුද්දක් පමණ බර වැඩ නොකරන ලෙස වෛද්‍යවරුන් ඔහුට උපදෙස් ලබා දී ඇත.

සහිඳු රංගන 2022 ජූලි මස 18 වන දින කෑගල්ල දිසා අධිකරණයේ දී විත්තිකරුවන් 11 ට එදිරිව නඩුවක් ගොනු කර ඇත.

විත්තිකරුවන්ගේ නීති විරෝධී ක්‍රියාවන් හේතුකොටගෙන පැමිණිලිකරු හට සිදු වූ කායික සහ මානසික පීඩනය, සිත තුළ ඇතිවූ බිය ගැන්වීම සහ තම ජීවිතයට එල්ල වූ තර්ජනය හේතුවෙන් සාමාන්‍ය අලාභ සහ දණ්ඩනීය අලාභ ලෙස රු. මිලියන 20ක් ද, විශේෂ අලාභ වශයෙන් රු.245,000ක මුදලක් ද වන්දි ඉල්ලා ඇත.

## 8. වෙඩි වැදී තුවාල වූ ආර්.ඒ. චමින්ද කුමාර රාජපක්ෂ

27/179, දියසුන්නත, රඹුක්කන ලිපිනයෙහි පදිංචි 37 හැවිරිදි චමින්ද කුමාර රාජපක්ෂ මහතා සෞඛ්‍ය කාර්ය සහයකයෙකු වශයෙන් සේවය කරයි. ඔහු විවාහක එක් දරු පියෙකි.

චමින්ද කුමාර අප්‍රේල් 18 වනදා ඔහුගේ ඥාති සහෝදරයෙකු ගේ මරණය පිළිබඳ අවසාන කටයුතු කර ඒ නිවසෙහි තිබූ ඉතිරි වැඩ කටයුතු කරමින් සිට ඇත. අප්‍රේල් 19 වනදා රඹුක්කන සිදුවීම අතරතුර පොලීසිය විසින් එල්ල කරනු ලැබූ කඳුළු ගෑස් ප්‍රහාර ඔහු රැඳී සිටි මියගිය ඥාති සොයුරාගේ නිවස යාබද ස්ථානයකටට වැටීම හේතුවෙන් ප.ව 4ට පමණ ඔහු නිවසින් පිටතට පැමිණ ඇත්තේ සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳ අදහසක් ලබා ගැනීමටය. ඉන්පසු විනාඩි කිහිපයක් ගෙවී යාමත් සමග චමින්ද කුමාරගේ උදරය ප්‍රදේශයට වෙඩි වැදී ඇත. අනතුරුව එතැන සිටි දෙදෙනෙක් ඔහුව ලොරියකට නංවාගෙන ඇති අතර එම ලොරියටම වෙඩි වැදී තුවාල ලැබූ චමින්ද ලක්ෂාන් ව සහ තවත් තුවාල කරුවන් දෙදෙනෙකු ඇතුළු කරගත් බව ඔහු පවසා සිටියි. පළමුවෙන්ම ඔවුන්ව රඹුක්කන රෝහලටත් ඉන්පසුව කෑගල්ල රෝහලටත් ඇතුළත් කර ඇත.

## 9. වෙඩි වැදී තුවාල වූ ඩබ්ලිව්. ඩී මිලංග හංසක වික්‍රමසූරිය

19 හැවිරිදි ඩබ්ලිව්. ඩී මිලංග හංසක වික්‍රමසූරිය මෙම සිදුවීම වන්නට පෙර ප්‍රදේශයේ වෙළෙඳසැලක සහයකයෙකු වශයෙන් සේවය කර ඇත.

අප්‍රේල් 19 වෙනිදා ඔහු සහ ඔහුගේ මිතුරන් කිහිපදෙනෙක් විරෝධතාවය පැවතුණු ස්ථානයට ගොස් ඇති අතර ප්‍රථමයෙන්ම කඳුළු ගෑස් ප්‍රහාරයට ඔහු ලක්වී ඇති බවත් ඉන්පසු මුහුණ සෝදාගෙන නිවසට පැමිණෙන්නට සැරසුණු මොහොතේදී ඔහුගේ පාදයට වෙඩි වැදී ඇත. එහිදී ඔහුගේ වළලුකර ප්‍රදේශයේ අස්ථි බිඳී ඇති බව ඔහුගේ මව ප්‍රකාශ කර සිටියි.

# ජාත්‍යන්තර ප්‍රජාවෙන් හා සිවිල් සමාජයෙන් ප්‍රතිචාර

රඹුක්කන සිවිල් විරෝධතාකරුවන්ට එරෙහිව බලධාරීන් විසින් භාවිතා කරන ලද අධික බලය සහ එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ මරණ සහ තුවාල දේශීය හා ජාත්‍යන්තර සිවිල් සමාජය සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විසින් පුළුල් ලෙස හෙළා දකින ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා නීතීඥ සංගමය ද ස්වාධීන විමර්ශනයක් ඉල්ලා සිටියේය. පොලීසිය සහ සන්නද්ධ අංශ විසින් උපරිම සංයමයකින් යුතුව ජනතාවගේ උද්ඝෝෂණ පිළිබඳව කටයුතු කළ යුතු බව අවධාරණය කරන බව ශ්‍රී ලංකා නීතීඥ සංගමය නිකුත් කළ නිවේදනයේ දැක්විණි.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය
இலங்கைச் சட்டத்தரணிகள் சங்கம்
BAR ASSOCIATION OF SRI LANKA

19.04 2022.

**STATEMENT BY THE BAR ASSOCIATION OF SRI LANKA ON THE INCIDENT AT RAMBUKKANA**

The BASL is shocked and saddened at the loss of life in the incident this evening at Rambukkana where the police are alleged to have shot at protesters. An independent investigation must be done and the Government must ensure that the police and armed forces act with utmost restraint in the light of the genuine grievances of protesters. We are saddened that previous warnings made by us as far back as January 2022 went unheeded by the authorities. Our members will continue to do their utmost to safeguard the rights of the people of this country. A detailed statement will follow.

**SALIYA PIERIS, PC**
**PRESIDENT**
**BAR ASSOCIATION OF SRI LANKA**

**ISURU BALAPATABENDI**
**SECRETARY**
**BAR ASSOCIATION OF SRI LANKA**

# රඹුක්කන සිදුවීම සම්බන්ධව
# මානව හිමිකම් කොමිෂන් සභාව ගත් ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් කණ්ඩායම 2022 අප්‍රේල් 20දාම සිදුවීම් දාමය සිදුවූ ස්ථානයට පැමිණ මූලික ස්ථාන පරීක්ෂණය සහ මූලික විමර්ශනය සිදුකොට ඇත. 2022 අප්‍රේල් 24 වැනි දින, වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යවරයා මානව හිමිකම් කොමිසමෙන් ඉල්ලා සිටි ඇති අතර 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14වන වගන්තිය යටතේ ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා වරමක් සහිත බහුවිධ විශේෂඥ මණ්ඩලයක් පත් කරන ලදි. මෙම විද්වත් මණ්ඩලය සැසිවාර කිහිපයක් පවත්වා ඇති අතර ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කොට ඇත.

එසේම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස්පති චන්දන ඩී. වික්‍රමරත්න, මධ්‍යම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, මධ්‍යම පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති, කෑගල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, කෑගල්ල සහ රඹුක්කන පොලිස් ස්ථාන භාර නිලධාරීන් යන පොලිස් නිලධාරීන්ගෙන් රඹුක්කන ප්‍රදේශයේ සිදුවූ වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සඳහා කටඋත්තර ලබාගෙන ඇත.

# පාර්ලිමේන්තු විවාදය

රඹුක්කන සිදුවීම සම්බන්ධයෙන් මහජන ආරක්ෂක ඇමති ප්‍රසන්න රණතුංග මහතා විසින් 2022 අප්‍රේල් 20දා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් සිදුකරන ලදි. එම ප්‍රකාශය පදනම් කරගෙන උණුසුම් විවාදයක් ඇතිවිය.

සිදුවීම සම්බන්ධයෙන් කණගාටුව පළ කළ ඇමතිවරයා පැය 10කට ආසන්න කාලයක් උද්ඝෝෂකයන් සාමාන්‍ය ජන ජීවිතයට බාධා කරමින් උද්ඝෝෂණ කළ බව පැවසීය. කලහකාරීන් ත්‍රිරෝද රථවලට ගිනි තැබූ බව ද, ඉන්ධන ලීටර් 33,000ක් සහිත බව්සරයක් ගිනි තබන්නට සූදානම් වූ අවස්ථාවේදී පොලිසිය තමන්ට පැවරී ඇති බලතල අනුව එය පාලනය කළ බව ද ඔහු පැවසීය. වෙඩිතැබීම සිදුවන්නේ උද්ඝෝෂකයන් පාලනය කිරීමට කළ හැකි සියලු දේ කිරීමෙන් පසුව බව ඔහු පැවසීය. 2021දී සියෙරා ලියොන් රාජ්‍යයේදී බව්සරයක් ගිනි ගැනීම නිසා 151ක් දැවී ගිය බව ද ඔහු පැවසීය.

ඇමතිවරයාගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් කතා කළ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පොලිසිය භාවිතා කර ඇත්තේ අවම බලය නොවන බව පෙන්වා දුන්නේය. ඉන්ධන බව්සරය පැය ගණනක් නතර කර තබාගෙන සිටියේ මිල වෙනස් වන තෙක් බව ඔහු පෙන්වා දුන්නේය.

එහිදී කතා කළ විදුලි බල හා බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර මහතා තෙල් බව්සරය පර්යන්තයෙන් පිටත් වූ වේලාව ඇතුළත් තොරතුරු ලේඛනය සභාගත කළේය. අංක WP LX 2735 දරණ බව්සරය මුතුරාජවෙල පර්යන්තයෙන් උදේ 8.20ට පිටත් වූ බව ද, එය රඹුක්කන සමුපකාර ඉන්ධන පිරවුම්හල සහ තවත් පිරවුම්හල් දෙකකට ඉන්ධන රැගෙන ගිය බව ද සඳහන් කළේය. එම බව්සරය රඹුක්කනට ළඟා වී තිබෙන්නේ පෙ.ව. 11.20ට බව ද ඔහු පැවසීය.

රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීවරයා කතා කරමින් මියගිය චමින්ද ලක්ෂාන් හිටපු එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී සන්දිත් සමරසිංහගේ ආධාරකරුවකු බව ද, ඔහු බව්සර් ගිනිතැබීම් වැනි ක්‍රියාවල යෙදෙන්නෙකු නොවන බව ද, මෙම උද්ඝෝෂණ කිසිවකු විසින් සංවිධානය කළ ඒවා නොවන බව ද පෙන්වා දුන්නේය.

රඹුක්කන ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුව ඇමතූ මහාමාර්ග අමාත්‍ය කනක හේරත් මහතා පැවසූ පරිදි උද්ඝෝෂණය ආරම්භ වී තිබෙන්නේ අළුයම 1.30ට පමණය. කිසියම් පිරිසක් ත්‍රිරෝද රථ 50කට, 100කට වැඩි ගණනක් විවිධ ප්‍රදේශවලින් ගෙනැවිත් ඉන්ධන පිරවුම්හල අවට මාර්ග අවහිර කර පොලිසියට එතැනට එන්නට බැරි තත්වයක් ඇතිකර තිබුණු බව පෙන්වා දුන්නේය. කෙසේ වෙතත්, උදෑසන 11.30 වන විටත් කිසිම ගැටලුවක් නොතිබුණු උද්ඝෝෂණය වෙනස් අතකට හරවන්නට කණ්ඩායමක් කටයුතු කළ බවත්, එම කණ්ඩායම තමන් නොහඳුනන බවත් ඔහු පැවසීය.

එයට විරෝධය පළ කළ කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතා ත්‍රිරෝද රියට ගිනිතැබීම පොලිසිය විසින්ම කළ බවට සාක්ෂි සහිත වීඩියෝවක් ඇති බව පැවසීය.

මන්ත්‍රී භාරතී දුෂ්මන්ත රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති බස්නායකට චෝදනා කරමින් ඔහු බව්සරය හිතාමතා ප්‍රමාද කළ බව පැවසීය. පැරණි මිලට තෙල් විකිණීම ඔහු ප්‍රතික්ෂේප කළ බව ද මන්ත්‍රීවරයා පැවසීය.

# නීතිමය ක්‍රියාමාර්ග

වෙඩිතැබීමට අණ දුන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.බී. කීර්තිරත්න සහ වෙඩිතැබීම් සිදුකළ පොලිස් නිලධාරීන් තිදෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී. රිමාන්ඩ් භාරයට පත්කරන ලද ඔවුන් පසුව ඇප පිට නිදහස් කරන ලදී. මෙම සිද්ධිය සම්බන්ධයෙන් පොලීසියේ 125 දෙනකුගෙන් හා සිවිල් වැසියන් 113 දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට වාර්තා කරන ලදී.

# වර්තමාන තත්ත්වය

2022 අප්‍රේල් 19දා රඹුක්කන දී ඇති වූ විරෝධතාවය සහ ඒ සම්බන්ධ සිදුවීම් සියළුම මුද්‍රිත සහ රූපවාහිනී මාධ්‍යයන් හරහා වාර්ථා කළද මේ වන විට ඒ පිළිබඳව එම නඩු විභාගයන් හා විමර්ශන සම්බන්ධයෙන් පවා කිසිදු මාධ්‍යයක් විසින් වාර්තා කරන්නේ නැත. සිවිල් සමාජ සංවිධාන ද ඒ සම්බන්ධයෙන් අමතක කර ඇති බවක් පෙනේ. අඛණ්ඩව මේ සිදුවීමේ වින්දිතයන් සමඟ සම්බන්ධකම් පවත්වන්නේ සුළු මානවහිමිකම් සංවිධාන සංඛ්‍යාවක් පමණි.

මේ හා සම්බන්ධ විමර්ශන වාර්තා කිසිවක් ප්‍රසිද්ධ කර නොමැත.

# මියගිය හෝ තුවාල ලැබූවන් වෙනුවෙන් රජය ගෙන ඇති පියවර

2022 අප්‍රේල් 19 වනදා රඹුක්කන දී සිදු වූ සිදුවීම අතරතුර මියගිය හෝ තුවාල ලැබූ වින්දිතයන් හට රජය හෝ රජයේ පාර්ශවයන් කිසිදු සහනයක්, වන්දියක්, හානිපූර්ණයක් ලබා දී නොමැත. නමුත් වින්දිතයන් පවසන පරිදි පෞද්ගලික පරිත්‍යාගශීලියෙකු වෙතින් ඔවුන්ට යම්කිසි සහනයක් ලැබී ඇත.

# නිගමනය

2022 අප්‍රේල් 19දා රඹුක්කනදී සිදුවූ ප්‍රචණ්ඩත්වයට අදාළ රජයේ පාර්ශ්ව රැසක් තිබේ. රටේ ආර්ථිකය දැඩි ලෙස අස්ථාවර තත්වයට පත්කර තිබූ අතර, ඉන්ධන පෝලිම් රට පුරා සුලබ විය.

රඹුක්කන ප්‍රදේශයට දින ගණනාවක් තිස්සේ ඉන්ධන ලැබී නොතිබිණි. අවසානයේ ඉන්ධන ලැබෙන විට මිල විශාල වශයෙන් ඉහළ නංවා තිබිණි.

ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 338 ක්, ඔක්ටේන් 95  පෙට්‍රල් ලීටරයක් රුපියල් 373 ක් , ඔටෝ ඩීසල් ලීටරයක් රුපියල් 289 ක් සහ සුපර් ඩීසල් ලීටරයක් රුපියල් 329 ක් දක්වා ඉහළ නංවන ලදි. මෙම මිල ඉහළ දැමීමේදී ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 84 කින්, ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයක් රුපියල් 90 කින්, ඔටෝ ඩීසල් ලීටරයක් රුපියල් 113 කින් සහ සුපර් ඩීසල් ලීටරයක් රුපියල් 75 කින් ඉහළ ගොස් තිබිණි.

රජයට සම්බන්ධ රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ඉන්ධන පිරවුම්හල විසින් ඉන්ධන බව්සරය කලින් ලබාගෙන මිල වැඩි වෙන තෙක් සඟවාගෙන සිටි බවට මතයක් ජනතාව අතර පැතිර ගොස් තිබිණි. එහෙත්, පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද ලේඛන අනුව, එය වැරදි අදහසකි. ඉන්ධන අඩු මිලට විකිණීමේ අවසරයක් ඉන්ධන පිරවුම්හලේ කළමනාකාරීත්වයට නැත.

එහෙත්, මෙම කරුණු අවබෝධ කරගැනීමේ උවමනාවක් උදඝෝෂකයන් අතර තිබුණු බවක් නොපෙනේ. දින ගණනකින් නොලැබුණු ඉන්ධන පිරවුම්හල වෙත ලැබී තිබුණත්, ඔවුහු නව මිල යටතේ ඉන්ධන ලබාගැනීම ප්‍රතික්ෂේප කළහ.

කෙසේ වෙතත්, ආර්ථික අර්බුදය, භාණ්ඩ හිඟය, මිල ඉහළ යාම, දිගු පෝලිම් ආදිය නිසා මහජනයා අතර පැතිර තිබූ අසහනය හේතුවෙන් පැනනැගෙන මෙවැනි තත්වයන් බුද්ධිමත්ව කළමනාකරණය කරගැනීමේ හැකියාව සහිත ව්‍යුහයන් ඒ වන විට රටේ නොපැවතිණි. යම් යම් බලවේග විසින් මෙම තත්ත්වය දේශපාලන වාසි සඳහා භාවිතා කළ බව රහසක් නොවේ.

එහෙත්, රඹුක්කන සිදුවීම සම්බන්ධයෙන් පොලිසියට එල්ල වෙන චෝදනා බරපතලය. උද්ඝෝෂණය සම්බන්ධයෙන් පොලිස් බලතල ක්‍රියාත්මක කිරීමේ ගැටලුවලට අමතරව ප්‍රචණ්ඩත්වය ඇවිළවීමට දායක වූ බවට ද පොලිසියට චෝදනා එල්ල වේ.

ශ්‍රී ලංකාවේ පසුව ඇති වූ සිදුවීම් සමුදායේ ප්‍රබලකම හේතුවෙන් රඹුක්කන සිදුවීම පිළිබඳ විමර්ශන නොවැදගත් තත්වයකට පත්වී තිබෙන බව පෙනේ. කෙසේ වෙතත්, මහජන උද්ඝෝෂණ සම්බන්ධයෙන් පොලිසිය කටයුතු කළ යුතු ආකාරය තුළ තිබිය යුතු වෘත්තිකභාවයේ වගකීම නැවත අවධාරණය කිරීමට මෙම විමර්ශනයේ සොයාගැනීම් ඉතා වැදගත් වනු ඇත. එසේම, මෙහිදී වැරදි සිදුකර තිබෙන පාර්ශ්ව හඳුනාගෙන ඔවුන්ට නීති ප්‍රකාරව දඬුවම් කිරීමත්, වින්දිතයන් හා දිවි ගලවාගත් අය වෙනුවෙන් වන්දි ගෙවීමත් අතිශය වැදගත්ය.

සිවිල් සමාජය හා ජනමාධ්‍ය පැත්තෙන් ද නිරීක්ෂණය කළ හැකි බරපතල ගැටලුවක් තිබේ. එනම්, මෙවැනි බරපතල සිදුවීම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ වගකීම කෙරෙහි ඔවුන් අවධානය යොමු කළ යුතුය.

# ආශ්‍රිත ලේඛන

**5./5.1/5.2/5.3**
https://www.bbc.com/sinhala/sri-lanka-61176472
https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://www.hrcsl.lk/wp-content/uploads/2022/07/Interim-Report-of-the-Committee-of-Experts-appointed-by-the-Human-Rights-Commission-of-Sri-Lanka-HRCSL-to-investi-gate-the-Police-Shooting-incident-that-took-place-in-¾mbukkana-on-19th-April-2022.pdf&ved=2ahUKEwjah9iZlL-L6AhWNxDgGHfUYBc4QFnoECBQQAQ&usg=AOvVaw2OW3n¾CljM3HVDc4aco1M

**5.4.**
https://www.bbc.com/sinhala/sri-lanka-61176472

**5.5.**
https://www.bbc.com/sinhala/sri-lanka-61176472


**5.6.**
https://ceylonnewsfactory.com/%E0%B7%83%E0%B7%8A%E0%B7%80%E0%B7%8F%E0%B6%B0%E0%B7%93%E0%B6%B1-%E0%B6%9A%E0%B6%B8%E0%B7%92%E0%B6%A7%E0%B7%94%E0%B7%80%E0%B7%99%E0%B6%B1%E0%B7%8A-%E0%B6%85%E0%B6%B0%E0%B7%92%E0%B6%9A%E0%B6%B-B%E0%B6%AB/

**5.7/5.8**
https://mawbima.lk/2022/04/23/%E0%B6%BB%E0%B6%B9%E0%B7%94%E0%B6%9A%E0%B7%8A%E0%B6%9A%E0%B6%B1-%E0%B6%9D%E0%B7%8F%E0%B6%AD%E0%B6%B1%E0%B6%BA%E0%B7%9A-%E0%B6%BD%E0%B7%9A-%E0%B7%80%E0%B7%90%E0%B6%9A%E0%B7%92-%E0%B6%BB%E0%B7%84/

**5.9.**
https://www.silumina.lk/2022/05/07/%E0%B7%80%E0%B7%92%E0%B7%81%E0%B7%9A%E0%B7%82%E0%B7%8F%E0%B6%82%E0%B6%9C/%E0%B6%B4%E0%B7%9C%E0%B6%BD%E0%B7%92%E0%B7%83%E0%B7%8A-%E0%B7%80%E0%B7%99%E0%B6%A9%E0%B7%92-%E0%B6%B4%E0%B7%84%E0%B6%BB%E0%B7%99%E0%B6%B1%E0%B7%8A-%E0%B6%BB%E0%B6%B9%E0%B7%94%E0%B6%9A%E0%B7%8A%E0%B6%9A%E0%B6%B1%E0%B6%AF%E0%B7%93-%E0%B6%B8%E0%B7%92%E0%B6%BA%E0%B6%9C%E0%B7%92%E0%B6%BA-%E0%B6%A0%E0%B6%B8%E0%B7%92%E0%B6%B1%E0%B7%8A%E0%B6%AF%E0%B6%9C%E0%B7%9A-%E0%B6%B1%E0%B7%92%E0%B7%80%E0%B7%99%E0%B7%83%E0%B6%A7-%E2%80%98%E0%B7%83%E0%B7%92%E0%B7%85%E0%B7%94%E0%B6%B8%E0%B7%92%E0%B6%AB%E2%80%99-%E0%B6%9C%E0%B7%92%E0%B6%BA-%E0%B6%9C%E0%B6%B8%E0%B6%B1

**14.**
https://basl.lk/statement-by-the-bar-association-of-sri-lanka-on-the-incident-at-¾mbukkana/

**15.**
https://www.hrcsl.lk/the-hrcsl-starts-an-independent-inquiry-on-the-police-shooting-incident-at-¾mbukkana-on-19th-april-2022-and-alleged-violations-of-the-rule-of-law-on-9th-and-10th-may-2022/
https://colombogazette.com/2022/04/22/human-rights-commission-records-statement-from-igp/
https://www.themorning.lk/hrcsl-summons-igp-and-top-cops-over-¾mbukkana/



**Right to Life Human Rights Centre**
No. 56/02, Palitha Place, Colombo 09.
Tel/ Fax : 011 266 9100
E-mail : right2lifelk@gmail.com
Web : www.right2lifelanka.org